# 1984 ආර්ථික ක්‍රියාකාරිත්වය, ගැටළු සහ ප්‍රතිපත්ති

## හැඳින්වීම

1984 දී ශ්‍රී ලංකාවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) සියයට 5.1 න් වැඩි විය. ඉකුත් වසරේ එය වැඩිවූයේ සියයට 5.0 කිනි. 1982 ස්ථාවර සාධක පිරිවැය අනුව දළ ජාතික නිෂ්පාදිතය (ද. ජා. නි) මෙම වසරේදී සියයට 5.3 කින් වැඩි වූ අතර, එය 1983 දී වාර්තා වූ සියයට 4.1 ට වඩා සැළකිය යුතු වැඩිවීමකි. මෙම වැඩිවීමට හේතු වූයේ 1984 දී දළ දේශීය නිෂ්පාදිතය වැඩි වුවද, සාධක ආදායම් විදේශවලට ගලායාමේ ශුද්ධ වටිනාකම 1983 දී පැවති මට්ටමෙහිම පැවතීමයි.

**1 . 1 සංඛ්‍යා සටහන**

**ජාතික ආදයම් සංඛ්‍යා 1982 – 1984**

| ශීර්ෂය | වටිනාකම (රු. දශ ලක්ෂ) | | | වර්ධන අනුපාතිකය (සියයට) | |
|---|---|---|---|---|---|
| | 1982(අ) | 1983(අ) | 1984(අ) | 1983 | 1984 |
| 1· පවත්නා සාධක වියදම් මිළ අනුව ද. දේ. නි. .. | 93,194 | 1,11,976 | 1,38,173 | 20·2 | 23.4 |
| 2· ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව ද. දේ. නි. .. | 93,194 | 97,899 | 1,02,906 | 5·0 | 5.1 |
| 3· පවත්නා සාධක වියදම් මිළ අනුව ද.ජා.නි. | 91,235 | 1,08,762 | 1,34,817 | 19·2 | 24·0 |
| 4· ස්ථාවර (1982)) සාධක වියදම් මිළ අනුව ද. ජා. නි. .. | 91,235 | 94,963 | 99,949 | 4·1 | 5·3 |
| 5· මැදි-වසර ජනගහනය ('000) .. | 15,189 | 15,416 | 15,599 | 1·5 | 1.2 |
| 6· ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය (රුපි.) | | | | | |
| i. පවත්නා මිළ අනුව .. | 6,007 | 7,055 | 8,643 | 17·4 | 22.5 |
| ii. ස්ථාවර මිළ අනුව .. | 6,007 | 6,160 | 6,407 | 2·5 | 4.0 |


(අ) තාවකාලිකයි

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

පවත්නා සාධක පිරිවැය මිළ අනුව 1984 දී දළ ජාතික නිෂ්පාදිතය රුපියල් 13,482 කෝටියක් වූ අතර, එය 1983 වසරට වඩා සියයට 24 ක වැඩිවීමක් පෙන්වයි. මූර්ත ජාතික නිෂ්පාදිතයේ වැඩිවීම ගණන් ගත් විට 1984 දී, ද.ජා.නි. අවධමනකය සියයට 17 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙය 1983 දී වාර්තා වූ සියයට 16 ක මිළ වැඩිවීම්වලට වඩා සුළු වැඩිවීමකි. ප්‍රධාන වශයෙන්, තේ සහ රබර් වැනි කෘෂිකාර්මික අපනයනවලට ලැබුණු ඉහළ මිළ ගණන් මෙම වැඩිවීමට බොහෝ දුරට බලපා තිබේ.

රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ දෙපාර්තමේන්තුව මගින් සැපයූ ඇස්තමේන්තුවලට අනුව, 1984 දී ශ්‍රී ලංකාවේ ජනගහනය සියයට 1.2 න් වැඩි විය. ජනගහනයේ මෙම වැඩිවීම සඳහා හැලපීමෙන් පසු, මූර්ත ඒක පුද්ගල ආදායම සියයට 4 න් වැඩි වූ අතර, එය පසුගිය වසරේ සියයට 2.5 ක් විය. පවත්නා මිළ ගණන් අනුව ඒක පුද්ගල දළ ජාතික ආදායම රුපියල් 8,643 ට (1984 පැවති සාමාන්‍ය විනිමය අනුපාතිකය අනුව එ.ජ. ඩොලර් 340) ඇස්තමේන්තු කර ඇත.

# දළ ජාතික නිෂ්පාදිතය




ශ්‍රී ලංකා මහ බැංකුව.

1984 ද.දේ.නි. වර්ධනයේ මූර්ත සංයුතිය විග්‍රහ කිරිමේදී පෙනී යන්නේ, ද.දේ.නි. සියයට 5.1 න් වැඩිවීම බොහෝ දුරට කර්මාන්ත සහ සේවා අංශයන්හි වඩා දියුණු ක්‍රියාකාරිත්වයෙහි ඒකාබද්ධ ප්‍රතිඵලය බවයි. කෘෂිකර්ම අංශය තුළ පොල් සහ වී නිෂ්පාදනය අඩුවීම හැරුණු විට, 1983 සමග සසඳන කල අන් සෑම අංශයකම තුලනාත්මක වර්ධනයක් පැවතිණි. 1983 දී ආදායම ජනිතවීම ප්‍රධාන වශයෙන්ම, කෘෂිකර්ම සහ සේවා අංශවලට සීමාවී තිබිණි. 1984 දී නිෂ්පාදන කර්මාන්ත අංශයේ එකතු වූ අගය සියයට 12.3 කින් වැඩි වූ අතර, එය ඉකුත් වසරට වඩා අධික වැඩිවීමකි. ඒ අතර, පසුගිය අවුරුදු කීපය තුළ සාපේක්ෂ වශයෙන් වැඩි වර්ධනයක් වාර්තා කළ සේවා අංශය 1984 දී සියයට 5.8 කින් වැඩි විය. කෘෂිකාර්මික අංශයෙහි වර්ධනය සියයට 2.2 දක්වා සැළකිය යුතු ලෙස පහත වැටිණි. තැනීම් කටයුතුවලද වර්ධන වේගයේ සුළු අඩුවීමක් දක්නට ලැබිණි.

දළ දේශීය නිෂ්පාදනය සංයුක්ත වන විවිධ අංශයන් හි ඒකීය වර්ධන රටාවක් පසුගිය වසර කීපය තුළදී දක්නට නැත. ද.දේ.නි. යේ ආංශීය සංවර්ධන මූලයන් වෙනස් වන අයුරින් මෙය පෙනේ. 1984 දී කෘෂිකාර්මික අංශයේ දුර්වල ක්‍රියාකාරිත්වයට හේතු වූයේ වී සහ පොල් උප අංශවල නිෂ්පාදනය පහත වැටීමයි. 1983 දී ඉහළම වර්ධන මට්ටමක් දක්වූ වී නිෂ්පාදනයේ එකතු කළ අගය, 1983–84 මහ කන්නයේදී ගංවතුර හානි නිසා සියයට 2 කින් පහත වැටුණි. පසුගිය වසරේ අයහපත් කාලගුණය පොල් කර්මාන්තය කෙරෙහි ද බලපෑ අතර, එහි එකතු කළ අගය දෙවැනි වරටත් මේ වසරේදී අඩුවිය. රබර් නිෂ්පාදනය සියයට 1.5 ක සුළු වැඩිවීමක් දක්වී ය. වී හා පොල් නිෂ්පාදනයේ එකතු වූ අගයේ අඩුවීම හිලව්කිරීමට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා, තේ නිෂ්පාදනයේ වාර්තා වූ සියයට 16 ක අගයේ එකතුව සමත් විය. අනෙකුත් කෘෂි අංශවල වර්ධනයද ඉහළ මට්ටමක පැවතිණි. නිෂ්පාදන කර්මාන්ත 1984 දී ප්‍රධාන වර්ධන අංශයක් වූ අතර, වඩා දියුණු ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. තේ නිෂ්පාදනයේ වර්ධනය වෘක්ෂ භෝග සැකසුම් අංශයේ සියයට 10 ක අගයක් එකතු කිරීමේලා උදව් විය. මේ අංශයේ ඉකුත් වසරේ ඇතිවූ පසුබෑම හා සසඳන විට, මෙය සැළකිය යුතු දියුණුවක් වේ. 1983 දී සියයට 2 කින් පමණක් වර්ධනය වූ කම්හල් කර්මාන්ත 1984 දී රාජ්‍ය හා පෞද්ගලික කර්මාන්ත අංශවල වර්ධනයක් පිළිබිඹු කරමින් සියයට 15 ක තියුණු වර්ධනයක් පෙන්නුම් කළේය.

### 1·2 සංඛ්‍යා සටහන

### දළ ජාතික නිෂ්පාදිතයේ සංයුතිය සහ වර්ධනය 1982—1984

### (ස්ථාවර (1982) සාධක වියදම් මිල අනුව)


| අංශය | වටිනාකම (රුපියල් දශ ලක්ෂ) | | | වර්ධන අනුපාතිකය | |
|---|---|---|---|---|---|
| | 1982 (අ) | 1983 (අ) | 1984 (අ) | 1983 | 1984 |
| 1. කෘෂිකර්මය, වන සහ ධීවර | 24,964 | 26,294 | 26,866 | 5·3 | 2·2 |
| 1.1 තේ | 2,418 | 2,309 | 2,681 | – 4·5 | 16·1 |
| 1·2 රබර් | 770 | 865 | 878 | 12·3 | 1·5 |
| 1·3 පොල් | 3,263 | 2,992 | 2,564 | – 8·3 | –14·3 |
| 1·4 වී | 5,484 | 6,318 | 6,166 | 15·2 | – 2·4 |
| 1·5 අනෙකුත් (අතුරු භෝග, වන හා ධීවර ඇතුළු) | 13,029 | 13,810 | 14,577 | 6·0 | 5·6 |
| 2. පතල් හා කැනීම් | 2,238 | 2,413 | 2,449 | 7·8 | 1·5 |
| 3. නිමැවුම් කර්මාන්ත | 13,601 | 13,710 | 15,390 | 0·8 | 12·3 |
| 3.1 වෘක්ෂ භෝග සැකසීම | 2,846 | 2,715 | 2,983 | – 4·6 | 9·9 |
| 3.2 අනෙකුත් | 10,755 | 10,995 | 12,407 | 2·2 | 12·8 |
| 4. තැනීම් | 7,959 | 8,039 | 8,030 | 1·0 | – 0·1 |
| 5. සේවා | 44,432 | 47,443 | 50,171 | 6·8 | 5·8 |
| 6. ද. දේ. නි. | 93,194 | 97,899 | 102,906 | 5·0 | 5·1 |
| 7. විදේශීය ශුද්ධ සාධක ආදයම | –1,959 | –2,936 | –2,957 | — | — |
| 8. ද. ජා. නි. | 91,235 | 94,963 | 99,949 | 4·1 | 5·3 |

(අ) තාවකාලිකයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

## කාර්මික සම්භවය අනුව දළ ජාතික නිෂ්පාදිතය

ස්ථාවර (1982) සාධක වියදම් මිල අනුව




ශ්‍රී ලංකා මහ බැංකුව.

සේවා අංශයේ වර්ධනය වැඩි වශයෙන් තොග හා සිල්ලර වෙළඳාමේ එකතුකළ අගය් වැඩිවීම නිසා ඇති වූවකි. ආනයන හා අපනයන වෙළඳාමේ ඉහළ තත්ත්වයක් පැවැත්ම සේවා අංශයේ වර්ධන වේගය ඉහළ මට්ටමක රඳවා ගැනීමට උදව් විය. සේවා අංශයේ අනෙක් උප අංශවල වර්ධනය අඩු වූයේ සංචාරක උප අංශයේ දුර්වල ක්‍රියාකාරිත්වය නිසා ඊට අදාළ වෙනත් සේවාවන්ට තිබූ ඉල්ලුම පහත වැටීම නිසාය. සංචාරක ව්‍යාපාරය 1983 දී පත්වූ අඩපණ වීමේ තත්ත්වයෙන් තරමක් දුරට මිදුණු බවක් පෙනෙන්නට තිබුණි. කඩිනම් මහවැලි ව්‍යාපාරයේ ප්‍රධාන ව්‍යාපෘති දෙකක වැඩ අවසන් වූ නිසා තැනීම් අංශයේ වැඩිපුර වර්ධනයක් දක්නට නොලැබිණි. වික්ටෝරියා වේල්ල හා ජල විදුලි උමග ද මිනිපේ දකුණු ඉවුරු ඇල මාර්ගයේ ද වැඩ මේ වසර ප්‍රථම භාගයේදී අවසන් විය. පෞද්ගලික අංශයේ තැනීම් කටයුතු ද 1984 දී අඩු විය.

කෘෂිකර්මයේ විවිධ උප අංශ කෙරෙහි කාලගුණික තත්ත්වයන් අසම අයුරින් බලපා තිබේ. කෘෂිකර්ම අංශයේ අයහපත් වර්ධනයට මූලික වශයෙන් හේතු වූයේ ගංවතුර නිසා හානියට පත් වී නිෂ්පාදනය හා 1983 ඉඩෝරයේ බලපෑම නිසා හානියට පත් පොල් නිෂ්පාදනයයි. කෘෂි අංශයේ ඉතාමත් වැදගත් දියුණුව වූයේ තේ අංශය යථා තත්ත්වයට පත්වීමයි. වසරේ ප්‍රථම භාගයේ ලැබුනු තද අකල් වැසි මහ කන්නයේ ආහාර භෝග වගාවට අහිතකර වුව ද, තේ නිෂ්පාදනයේ වර්ධනයකට උදව් විය. පසුගිය දෙවසර තුළ දිගටම පහත වැටුණු තේ නිෂ්පාදනය 1983 මට්ටමේ සිට සියයට 16 ක වර්ධනයක් පෙන්නුම් කළේය. එය 1981 නිෂ්පාදන පරිමාවට සමාන විය. නිෂ්පාදන වර්ධනය හා ඉහළ මට්ටමක පැවති අපනයන මිල රාජ්‍ය හා පෞද්ගලික අංශවල නිෂ්පාදකයන්ට ඉතා අවශ්‍ය වූ අන්දමේ සහනයක් ලබාදුනි. මෙතෙක් කල් ඒ අංශවල ප්‍රතිලාභ ඉතා පහළ මට්ටමක පැවතිණි. තේ අංශයේ වඩා යහපත් ක්‍රියාකාරිත්වය රාජ්‍ය අයවැය හා ගෙවුම් ශේෂවල ක්‍රියාකාරිත්වය යහපත් කරවීමටද සමත් විය.

තේ උප අංශයේ දක්වුණු ප්‍රගතිය කෘෂිකර්මයේ අනෙක් උප අංශවල පිළිබිඹු නොකෙරිණි. රබර් නිෂ්පාදනය 1984 දී වැඩි වුව ද, එය 1983 දී වූ සියයට 12 ක වර්ධනය හා සසඳන විට සියයට 1.4 ක පමණ වූ සුළු වැඩිවීමකි. මේ වර්ධනය ද මුළුමනින්ම රාජ්‍ය අංශයේ වතුවලින් ලැබුණි. ඉකුත් වර්ෂයේ වාර්තා වූ වාසිදායක වර්ධනය හා සසඳන විට, පෞද්ගලික අංශයේ රබර් වවන්නන්ගේ නිමැවුම සියයට 3 කින් අඩු විය. මීට පෙර ද සඳහන් කළ පරිදි, 1983 වර්ෂයේ වැඩි කාලයක් පුරා පැවති නියඟයේ පසුකාලීන බලපෑම් නිසා පොල් වගා උප අංශයේ වර්ධනය පිරිහුණි. පොල් නිෂ්පාදනය සියයට 14 කින් පහත වැටෙමින් මෑත කාලයේ පොල් නිෂ්පාදනයේ වාර්තා වූ අඩුම මට්ටමට ලඟා විය. කෘෂිකාර්මික අංශයේ එකතු කළ අගයෙහි පොල් නිෂ්පාදනයට අධික කොටසක් හිමිවීම නිසා, එම අංශයේ සමස්ත ක්‍රියාකාරිත්වය කෙරෙහි මෙය අහිතකර ලෙස බලපෑවේය.

1984 වර්ෂයේදී, ආහාර භෝග අංශය තුළ වී මෙන්ම, අනිකුත් සුළු ආහාර භෝග නිෂ්පාදනයෙහි, පසු බෑස්මක් ඇති විය. කෙසේ වුව ද, මෙයට හේතුව අයහපත් කාලගුණික තත්ත්වය මිස, මෙම අංශයේ වර්ධන හැකියාවේ පහත වැටීමක් සිදුවීම නිසා නොවේ. 1983–84 මහ කන්නයේ වී නිෂ්පාදනය සියයට 24 කින් සැළකිය යුතු ලෙස පහත වැටුණි. කෙසේ වෙතත්, මහ කන්නයේ අඩු නිෂ්පාදනයේ බලපෑම ලිහිල් වන පරිද්දෙන් යල කන්නයේ නිමැවුම සියයට 52 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. වාරිමාර්ග මත බොහෝ දුරට රඳා පවතින යල කන්නයේ වී නිෂ්පාදන අංශය අඛණ්ඩ වර්ධන මාවතකට අවතීර්ණ වී ඇති බව පැහැදිලිව පෙන්නුම් කෙරේ. මහ කන්නයේ අයහපත් කාලගුණික තත්ත්වය නිසා පහත වැටුණ අතුරු ආහාර භෝග නිමැවුම වසර අවසාන භාගයේදී තරමක් දුරට යථා තත්ත්වයට පත් විය.

මෙතෙක් පැවති නිෂ්පාදනය අඩුවීමේ උපනතියට අනුව යමින්, 1984 වර්ෂයේදී ද සීනි නිෂ්පාදනයේ සියයට 15 ක පහත වැටීමක් වාර්තා විය. දුර්වල ජල පාලනය උක් අඩු නිෂ්පාදනයේ අඩුවීමට ප්‍රධාන හේතුවක් විය. ඉකුත් වසරේ නිෂ්පාදනයන් සමඟ සසඳන විට, ධීවර

අංශයේ නිමැවුම් සියයට 23 කින් සැළකිය යුතු ලෙස පහත වැටුණි. වෙරළබඩ මසුන් ඇල්ලීමේ කටයුතුවල දුර්වල ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් මේ අඩුවීම සිදු විය. කිරි නිෂ්පාදනය සියයට 3 කින් වැඩිවී යයි ඇස්තමේන්තු කර තිබෙන අතර, බිත්තර නිෂ්පාදනයේ සුළු අඩුවීමක් පෙන්නුම් කරයි.

1984 වර්ෂයේ ආර්ථික වර්ධනයට ප්‍රධාන වශයෙන් දායකත්වයක් ලබා දුන්නේ නිෂ්පාදන කර්මාන්ත අංශයයි. කම්හල් කර්මාන්තයන්හි නිමැවුමේ සියයට 15 ක සැළකිය යුතු වැඩිවීමක් වාර්තා වේ. මෙය පෞද්ගලික (සියයට 26) හා රාජ්‍ය (සියයට 7) යන අංශ දෙකේම වර්ධනයන්හි ඒකාබද්ධ ප්‍රතිඵලයකි. 1983 වර්ෂයේ කම්හල් කර්මාන්ත මුහුණ පෑ අපහසුකම් ගැන සලකා බලන විට, මෙම අංශයේ මෙවසර තුළ නව ප්‍රබෝධයක් ඇතිවීම කැපී පෙනෙන ලක්ෂණයක් විය. පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිෂ්පාදනයේ වැඩිවීම කෙරෙහි රෙදිපිළි සහ මසා නිම කළ ඇඳුම් හා වෙනත් කාර්මික භාණ්ඩ අපනයනයන් වැඩිවීම සැහෙන ආකාරයකින් බලපා ඇත. පෞද්ගලික කම්හල් කර්මාන්ත අංශයේ අඛණ්ඩ හා මනා ක්‍රියාකාරිත්වයට හේතුවූ පැහැදිලි කරුණක් වූයේ, රජය විසින් සපයන ලද සාධු බල මහින් ලත් වාසි දායක බලපෑමයි. කෙසේ වුවද, නිෂ්පාදන පලදායිතාවය හා කළමණාකාරිත්වය දියුණු කිරීම තුළින් ඉදිරි කාලයේදී පෞද්ගලික අංශයට තමන්ගේ නිෂ්පාදන ක්‍රියාකාරිත්වය ශක්තිමත් කිරීමට හා තරඟකාරී ස්වභාවයක් ඇතිකර ගැනීමට බොහෝ ඉඩ ප්‍රස්ථා ඇත.

රාජ්‍ය අංශයේ කර්මාන්තවල නිෂ්පාදනයේ සියයට 7 ක වැඩිවීමක් වාර්තා විය. කෙසේ වුවද, රාජ්‍ය අංශයේ සමස්ත ක්‍රියාකාරිත්වය කෙරෙහි, එම අංශය තුළ මුළු නිමැවුමෙන් සියයට 55 ක් හිමි ඛනිජ තෙල් නිෂ්පාදන මහින් විශාල බලපෑමක් ඇති විය. මෙසේ තෙල් පිරිපහදුවේ ක්‍රියාකාරිත්වය රාජ්‍ය අංශයේ කර්මාන්තවල ක්‍රියාකාරිත්වය කෙරෙහි දැඩි ලෙස බලපෑම නොකඩවා පැවතිණි. තෙල් පිරිපහදුවේ නිමැවුම රහිතව ගත් කල රාජ්‍ය අංශයේ කර්මාන්තවල නිමැවුමේ අඩුවීමක් පෙන්නුම් කැරේ. රාජ්‍ය අංශයේ කර්මාන්තවලින් වැඩි කොටසක් කළමණාකාරිත්ව, අලෙවිකරණ හා ද්‍රවශීලතා ප්‍රශ්නවලට මුහුණ පා තිබේ. නිෂ්පාදන හා ප්‍රාග්ධන පලදායිතා වැඩි කිරීමේ මාර්ගයෙන් රාජ්‍ය අංශයේ ව්‍යවසායයන් සාමාන්‍ය වශයෙන් තමන් විසින් ආයෝජනය කරන ලද අරමුදල්වලින් උපරිම ඵල ලබා ගත යුතුව ඇත.

කෘෂිකාර්මික නිෂ්පාදනයෙහි ඇති වූ අසම ක්‍රියාකාරිත්වයෙහි බලපෑම 1984 වසරේ දේශීය මිළ කෙරෙහි ද දක්නට ලැබිණි. සැපයුම් තත්ත්වය දුර්වල වීමත්, කලින් නියම කළ මිළ සංශෝධනයට භාජනය වීමත් හේතු කොටගෙන 1984 ප්‍රථම භාගයේදී ආහාර මිළ තියුණු ලෙස වැඩිවීමක් වාර්තා විය. අපනයන සඳහා ලද ඉහළ මිළද දේශීය මිළ ඉහළ යාමට හේතු විය. කෙසේ වුව ද, උද්ධමන අනුපාතයේ වේගයෙහි සැළකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණු මෙම වසරේ පසු භාගය වනවිට මෙම තත්ත්වයේ සැළකිය යුතු වෙනස්වීමක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂයේ අග සිට 1984 දෙසැම්බර් අග වන විට කොළඹ පාරිභෝගික මිළ දර්ශකයේ (කො.පා.මි.ද.) වාර්තා වූ වැඩිවීම සියයට 9 ක් විය. 1983 දී මෙම වැඩිවීම සියයට 21 ක් විය. එමෙන්ම, 1984 අවසානයේදී තොග අලෙවි මිළ දර්ශකයේ (තො.මි.ද.) වැඩිවීම සියයට 5 ක් විය. වසරේ පසුභාගයේදී තියුණු මිළ අඩුවීමක් සිදුවුවද, ප්‍රථම භාගයේදී පැවති ඉහළ මිළ හේතුකොට ගෙන 1984 වර්ෂයේ මිළෙහි වාර්ෂික සාමාන්‍යය 1983 වාර්ෂික සාමාන්‍යයට වඩා ඉහළ මට්ටමක විය. වාර්ෂික සාමාන්‍යය අනුව බලන විට, 1983 දී සියයට 14 ක වැඩිවීමක් දැක්වූ කොළඹ පාරිභෝගික මිළ දර්ශකය 1984 දී සියයට 17 කින් වැඩි විය. තොග අලෙවි මිළ දර්ශකයේ වාර්ෂික සාමාන්‍යය, ඉකුත් වසරේ සියයට 25 සමග සැසඳීමේදී, 1984 දී සියයට 26 ක වැඩිවීමක් පෙන්විය. කෙසේ වුව ද, වසර අවසානය දක්වාම මිළ අඩු වීමේ ප්‍රවනතාවයක් නොකඩවා පැවතීම අවධාරණය කළ යුත්තකි.

මිළෙහි සැළකිය යුතු පහත වැටීම් නිසා, වසර අවසානය වන විට කොළඹ පාරිභෝගික මිළ දර්ශකය සහ තොග අලෙවි මිළ දර්ශකයෙන් පිළිබිඹු වන පරිදි මිළ වැඩිවීම තනි ඉලක්කමට සීමා කිරීමට හැකි විය. මෙම මිළ පහත වැටීමට තුඩුදුන් සාධකයන් අතර, යහපත් අතට

හැරුණු සැපයුම් තත්ත්වය, (විශේෂයෙන් ආහාර සම්බන්ධව) රාජ්‍ය අයවැයෙහි අවධමනාත්මක බලපෑම සහ සීමාකාරී මුල්‍ය ප්‍රතිපත්තිවල සාර්ථකත්වය සහ ඉතිරි කිරීම් වැඩිවීම ප්‍රධාන ඒවා විය. මිළ මට්ටම්හි වර්ධන වේගය පහත වැටීමෙහිලා ආනයන ආශ්‍රිත උද්ධමන අනුපාතිකයේ පහත වැටුණු වර්ධන වේගය සහ සාපේක්ෂ වශයෙන් ස්ථායී බවක් පෙන්නුම් කළ විනිමය අනුපාතිකයද හේතු විය. මිළ මට්ටම් පහත වැටීම සඳහා වූ හේතු සාධක විමසීමෙහි දී දක්නට ලැබුණ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ උද්ධමන අනුපාතිකය පහත හෙළීමෙහිලා රජයේ අයවැය මගින් කළ දායකත්වයයි. පසුගිය කාලයේ පැවති විශාල ප්‍රමාණයක සමුච්චිත අයවැය හිඟය නිසා ඇතිවූ අයහපත් බලපෑම අඩුකරලන අයුරින් වර්තන ගිණුමේ ජනිත කරවන ලද ඉතිරි කිරීම් යොදා ගනිමින් ප්‍රාග්ධන වියදම් වලින් කොටසක් මූල්‍යකරණය කිරීම අයවැය කළමනාකරණයේ වැදගත් සිද්ධියක් විය. තියුණු මෙන්ම කැපී පෙනෙන අයුරින් අයවැය හිඟයේ ඇතිවූ අඩුවීම, වර්ෂය තුළ අනුගමනය කළ මූල්‍ය ප්‍රතිපත්තීන් හා ක්‍රියා මාර්ගයන්ට උපකාරී විය. කෙසේ වුවද, මෙම ප්‍රතිඵල මගින් තෘප්තියට පත්වීමට තරම් අවකාශ නැත. අයවැය හිඟය තවමත් ඉහළ මට්ටමක පවතින අතර, නිෂ්පාදනය හා සැපයුම් ප්‍රසාරණය කිරීම සඳහා පෞද්ගලික අංශය විසින් වඩවඩාත් සම්පත් යොදා ගැනීමට ඇති හැකියාව වැඩි කරලන සේ අයවැය හිඟය අඩුකළ යුතුව ඇත. නිශ්චිත මූල්‍ය ප්‍රතිපත්ති හා ක්‍රියා මාර්ගයන් විසින් උපකාරී වූ දැඩි අයවැය කළමනාකරණයක් මගින් ගොඩනැගී ඇති අධි ද්‍රවශීලතා ප්‍රමාණය අඩුකරලීම සඳහා සමස්ත ඉල්ලුම් පාලනය කිරීමේ ප්‍රතිපත්තියක් අවශ්‍ය වේ. මිළ ස්ථාවරත්වය තවදුරටත් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වාතාවරණයක් සැපයීම මගින් දැනටමත් අඩුකර ඇති උද්ධමන අනුපාතය පහත් මට්ටමක පවත්වාගත යුතුය.

වසර අවසාන වන විට, මිළ ඉහළ යාමේ වේගයෙහි වූ පහත වැටීම, මූර්ත වැටුප් කෙරෙහි හිතකර බලපෑමක් ඇති කරන ලදී. මූර්ත වැටුප් සම්බන්ධව ඉහළම වර්ධනය වාර්තා වූයේ, පඩි පාලක සභා කර්මාන්තයන්හි කම්කරුවන් සම්බන්ධයෙනි. 1984 වර්ෂය මුලදී සියයට 25.9 ක වැටුප් වැඩිවීමක් ලබාගත් කෘෂිකාර්මික කම්කරුවන්ගේ මූර්ත වැටුප් සියයට 7.6 කින් ඉහළ යාම හේතුවෙන්, මෙම ගණයෙහිවූ කම්කරුවන්ගේ මූර්ත වැටුප් සියයට 1.5 කින් ඉහළ ගියේය. මධ්‍යස්ථ වැටුප් වැඩිවීම් ලද කර්මාන්ත, වාණිජ සහ සේවා පඩි පාලක සභා මගින් පාලනය වන කම්කරුවන්ගේ මූර්ත වැටුප් ඉහළ යාමක් දක්නට නොලැබුණි. රාජ්‍ය අංශයෙහි ඇතැම් අංශවල සේවකයන්ගේ මුදල් වැටුප් ඉහළ යාමද මධ්‍යස්ථ විය. රාජ්‍ය අංශයෙහි සේවකයන් සම්බන්ධව වූ ප්‍රධාන ආදායම් ප්‍රතිලාභය 1984 දී ජීවන වියදම් දීමනාව සම්බන්ධව කරනු ලැබූ සංශෝධන දෙක මගින් සිදු විය. මෙවැනි වැටුප් දර්ශකාංක ගතකිරීමක් සමස්ත ඉල්ලුම පාලනය කිරීම කෙරේ අයහපත් බලපෑමක් ඇතිකිරීමට පුළුවන. මූර්ත වැටුප් හා ආදායම් වර්ධනය සමඟ ගැලපෙන ශ්‍රම ඵලදායිතාවය වැඩිකරලන සේ යොමුවිය යුතු සානුබලයන් සැපයීමට අවශ්‍ය වන ජාතික වැටුප් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ අවශ්‍යතාවය සැළකිල්ලට ගනිමින් මෙම ක්‍රමය විමර්ශනය කළ යුතුය.

දත්තයන්හි අඩුපාඩුකම් හේතු කොට ගෙන සේවා නියුක්තිය සම්බන්ධ වර්ධනයන් නිසි අයුරින් විමර්ශනය කිරීමට නොහැකි වී ඇත. කෙසේ වුව ද, ආර්ථිකයේ ආංශික වර්ධනයන් මත සළකා බලන කල සේවා නියුක්තියෙහි ඉහළ යාමක් සිදුවූ බව උපකල්පනය කිරීම සාධාරණය. විදේශ සහභාගිත්වය සහිත හෝ රහිත කාර්මික යෝජනා ක්‍රමයන්හි ඍජු සේවා නියුක්ති අවස්ථාවන් ඉහළ ගිය බව ආර්ථිකයෙහි ආංශික වර්ධනයන් මගින් පෙන්නුම් කෙරේ. ග්‍රාමීය සංවර්ධන කටයුතුවල ව්‍යාප්තිය මගින් ග්‍රාමීය අංශයෙහි සේවා වියුක්තිය සහ ඌන සේවා නියුක්තිය අඩු කරනු ලැබුණි. රාජ්‍ය අංශයෙහි සේවා නියුක්තියෙහි සුළු වැඩිවීමක් දක්නට ලැබුණි. කෙසේ වුවද, රජයේ ප්‍රාග්ධන වියදම සම්බන්ධයෙන් වූ සීමාවන් සහ ඵලදායීතාවය ඉහළ නංවා ගැනීමට දරණ ලද ප්‍රයත්නයන් හේතුවෙන් රාජ්‍ය අංශයෙහි නව සේවා නියුක්ති අවස්ථාවන් අඩු විය. අර්ධ රාජ්‍ය ආයතනයන්හි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ ආයතන ව්‍යුහයන් ප්‍රතිසංවිධානය සඳහා හඳුන්වා දුන් පියවරයන් එකී ආයතනයන්හි ද නව සේවා නියුක්ති අවස්ථාවන් අඩු කිරීමට බලපෑවේය.

## 1 . 3 සංඛ්‍යා සටහන

## ආයෝජන – ඉතිරි කිරීම 1980 – 1984

| වර්ගය | 1980 | | 1981 | | 1982 | | 1983 | | 1984(අ) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් දශ ලක්ෂ | % | රුපියල් දශ ලක්ෂ | % | රුපියල් දශ ලක්ෂ | % | රුපියල් දශ ලක්ෂ | % | රුපියල් දශ ලක්ෂ | % |
| **1. ආයෝජන – ඉතිරි කිරීම (දේශීය හා විදේශීය) ..** | **22,465** | **100·0** | **23,610** | **100·0** | **30,276** | **100·0** | **36,063** | **100·0** | **39,850** | **100·0** |
| භාණ්ඩ හා සාධක නොවන සේවා (ශුද්ධ) අඩුකොට .. | -15,021 | -66·9 | -13,666 | -57·9 | -18,758 | -62·0 | -18,365 | -50·9 | -8,374 | -21·0 |
| **2. දළ දේශීය ඉතිරි කිරීම ..** | **7,444** | **33·1** | **9,944** | **42·1** | **11,518** | **38·0** | **17,698** | **49·1** | **31,476** | **79·0** |
| එකතු කලා | | | | | | | | | | |
| සාධක සේවා (ශුද්ධ) .. | -432 | -1·9 | -1,868 | -7·9 | -1,959 | -6·4 | -3,214 | -8·9 | -3,356 | -8·4 |
| පෞද්ගලික සංක්‍රාම,(ශුද්ධ) .. | 2,260 | 10·1 | 3,918 | 16·6 | 5,494 | 18·1 | 6,441 | 17·8 | 7,039 | 17·6 |
| **3. දළ ජාතික ඉතිරි කිරීම ..** | **9,272** | **41·3** | **11,994** | **50·8** | **15,053** | **49·7** | **20,925** | **58·0** | **35,109** | **88·2** |
| **4. විදේශීය ඉතිරි කිරීම (1–3) ..** | **13,193** | **58·7** | **11,616** | **49·2** | **15,223** | **50·3** | **15,138** | **42·0** | **4,691** | **11·8** |
| නිල සංක්‍රාම (ශුද්ධ) .. | 2,281 | 10·1 | 3,118 | 13·2 | 3,379 | 11·2 | 4,016 | 11·1 | 3,902 | 9·8 |
| සහනදායක ණය (ශුද්ධ) (ආ) .. | 2,712 | 12·1 | 3,279 | 13·9 | 4,292 | 14·2 | 5,796 | 16·1 | 6,945 | 17·4 |
| වෙළෙඳ ණය ගැනීම් (ශුද්ධ) .. | 3,163 | 14·1 | 3,465 | 14·7 | 5,339 | 17·6 | 3,933 | 10·9 | 704 | 1·8 |
| සෘජු ආයෝජන .. | 710 | 3·2 | 947 | 4·0 | 1,323 | 4·4 | 887 | 2·5 | 911 | 2·3 |
| විදේශ වත්කම් (ශුද්ධ) භාවිතය (ඇ) | 2,967 | 13·2 | 406 | 1·7 | 1,009 | 3·3 | -342 | -0·9 | -7,062 | -17·7 |
| අනෙකුත් (ශුද්ධ) (ඈ) .. | 1,360 | 6·0 | 401 | 1·7 | -119 | -0·4 | 848 | 2·3 | -709 | -1·8 |
| **5. වෙළෙඳ මිළ යටතේවූ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස** | | | | | | | | | | |
| (i) ආයෝජන .. | 33·8 | | 27·8 | | 30·3 | | 29·6 | | 26·3 | |
| (ii) දළ දේශිය ඉතිරි කිරීම .. | 11·2 | | 11·7 | | 11·5 | | 14·5 | | 20·8 | |
| (iii) දළ ජාතික ඉතිරි කිරීම .. | 13·9 | | 14·1 | | 15·1 | | 17·2 | | 23·2 | |
| (iv) විදේශිය ඉතිරි කිරීම .. | 19·8 | | 13·7 | | 15·2 | | 12·4 | | 3·1 | |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) තාවකාලිකයි.

(ආ) වෙළෙඳ ණය ගැනීම් හැර මධ්‍යම ආණ්ඩුවේ විදේශීය ණය ලැබීම්(ශුද්ධ).

(ඇ) (–) සෘණ සලකුණින් ගෙවුම් තුලනයෙහි සමස්ත අතිරික්තය හඟවයි.

(ඈ) ගෙවුම් තුලනයෙහි විගැහි වෙන්කිරීම්, රුපියල් අගය පිළිබඳ ගැලපිලි සහ වැරදීම් හා අත්හැරීම් ආදියෙන් සමන්විතය.

පසුගිය වසර කීපය තුළ ඉතා පහත් මට්ටමක පැවති දේශීය ඉතිරි කිරීම් වර්ධනය හමුවේ කරනු ලැබූ ආයෝජන මූල්‍යකරණය, පවත්නා දේශීය සම්පත් සහ ආයෝජන වියදම අතර විශාල අසමතුලිතතාවයක් ඇති කොට ඇත. අයහපත් ජාත්‍යන්තර වාතාවරණයක් සහ පිරිහෙන වෙළෙඳ අනුපාතයක් හමුවේ රාජ්‍ය සහ පෞද්ගලික ආයෝජන ඉහළ මට්ටමකින් පවත්වා ගැනීම සඳහා ඉතිරි කිරීම් ඉහළ නැංවීමේ අවශ්‍යතාවය පිළිගනු ලැබ ඇත. පසුගිය වසර කිහිපය තුළදී දීමනා සහ සහනදායී ණය වලින් යුක්තවූ විදේශ ඉතිරි කිරීම් මගින් ආයෝජන/ඉතිරි කිරීම් පරතරය ප්‍රධාන වශයෙන් පියවා ගන්නා ලදී. විදේශ විනිමය සංචිත තත්ත්වයේ සැලකිය යුතු වැඩිවීම හේතු කොට ගෙන වෙළෙඳ ණය ගැනීම්වල පිහිට පැතීම සීමාසහිත පරිමාණයක සිදුවූ අතර, 1983 වර්ෂයෙන් ඔබ්බට එකී ණය නොපැවතීමත් සැලකිය යුතු කරුණකි. එමගින් ආයෝජන මූල්‍යකරණයෙහි ලා විදේශීය ඉතිරි කිරීම් ප්‍රමාණය ද සැලකිය යුතු ලෙස අඩුකරන්නට යෙදුනි. විදේශ ඉතිරි කිරීම් ප්‍රයෝජනයට ගැනීම 1983 දී වූ දළ ආයෝජනයෙන් සියයට 42 සිට 1984 දී සියයට 12 දක්වා පහත වැටුණි. ඉකුත් වසරේ වූ සියයට 14.5 සමඟ සසඳන කල, මෙම වසරේ දේශීය ඉතිරි කිරීම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 20.8 ක් වූ අතර, ප්‍රධාන වශයෙන් විදේශයන්හි සේවයේ නියුතු අයගේ ප්‍රේෂණයන් මගින් ඉහළ ගිය ජාතික ඉතිරි කිරීම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 23.2 දක්වා වැඩි විය. විදේශීය ඉතිරි කිරීම්හි නියම ගලාඒම් දළ ජාතික ඉතිරි කිරීම් හා දළ දේශීය ආයෝජනය අතර පැවති හිඟය ඉක්මවා පැවතියේය. මෙහි ප්‍රතිඵලය වූයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3 දක්වා අඩුවූ විදේශීය ඉතිරි කිරීම් යොදා ගැනීම පසුගිය හය වසර තුළ වාර්තා වූ අඩුම අනුපාතිකය වීමය, අතිරික්ත විදේශීය ඉතුරුම්, ගෙවුම් ශේෂයේ සමස්ත අතිරික්තය තුළින් පිලිබිඹු විය.

1984 දී දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙහි (ද.දේ.ප්‍රා.ස.) වර්ධනය තවදුරටත් අඩු විය. එය, 1983 දී වූ සියයට 21 හා සසඳන විට, වැඩිවූයේ සියයට 9 කින් පමණි. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙහි අඩු වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ වූ තැනීම් කටයුතු වලින් සැලකිය යුතු කොටසක් නිමවීම සහ රජය මගින් නව ප්‍රාග්ධන වියදම කපා හැරීමයි. කෙසේ වෙතත්, ආකර්ශණීය දිරි ගැන්වීම් මධ්‍යයේ වුව ද ප්‍රධාන ක්ෂේත්‍රයන් කිහිපයකම දක්නට ලැබුණු පෞද්ගලික අංශයේ ආයෝජනයේ පසුබෑම සැළකිල්ලට ලක්විය යුතු කරුණකි. මෙකී සාධකයන් මගින් දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය, පසුගිය සිව් වසර තුළ, දළ දේශීය ප්‍රාග්ධන නිෂ්පාදිතයේ සියයට 30 ක් වූ ඉහළ සාමාන්‍ය අනුපාතිකයක සිට 1984 දී සියයට 26 දක්වා පහතට ගෙන එනු ලැබීය. කෙසේ වෙතත්, වසර තුළ දක්නට ලැබුණු හිතකර ලක්ෂණයක් වූයේ, මුළු වියදමෙන් පරිභෝජනයේ කොටස අඩුවීමක් තුළින් ආයෝජනය වෙත සම්පත් විතැන් වීමක් පෙන්නුම් කිරීමය. 1983 දී සියයට 18 ක වර්ධනය හා සසඳන කල පරිභෝජන වියදම වැඩිවූයේ සියයට 15 කින් පමණි. මෙම වර්ධනයෙහි ප්‍රතිඵලය වූයේ කලින් සඳහන් කළ දේශීය ඉතිරි කිරීම්හි වූ කැපී පෙනෙන ඉහළ යාමයි. සීමාකාරී මූල්‍ය ප්‍රතිපත්තීන් හා ඉහළ දේශීය නිෂ්පාදනය සමඟ ඒකාබද්ධ වූ රජයේ අයවැය පරිපාලනය තවදුරටත් ශක්තිමත් කිරීම තුළින් මෙකී ඉහළ දේශීය ඉතිරි කිරීම් මට්ටම තවදුරටත් පවත්වා ගැනීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී. විදේශීය ආධාර ප්‍රවාහයන් සම්බන්ධයෙන් බලාපොරොත්තු වන අඩුවීම සහ ඉහළ නැගීමට ඉඩකඩ ඇති ණය සේවාබර හමුවේ පරිභෝජනය සීමා කිරීම, දේශීය ඉතිරි කිරීම ඉහළ නැංවීම සහ විදේශ විනිමය ඉපයීම වැඩි කිරීම සම්බන්ධව වන ප්‍රතිපත්ති ප්‍රයත්නයන් මඟහැරී යාමකට ඉඩ දිය යුතු නොවේ.

1984 වසර තුළ මූල්‍ය ක්ෂේත්‍රයෙහි වර්ධනයන් සම්බන්ධව කැපී පෙනුනේ, මුදල් හා ණය වැඩිවීමේ අනුපාතිකයන්හි අඩුවීම, මූල්‍ය ක්‍රමයේ පැවති ඉහළ ද්‍රවශීලතාවය සහ විශේෂයෙන් තැන්පතු සම්බන්ධව පොළී අනුපාතිකයන්හි වූ පහත වැටීමයි. සැළකිය යුතු ලෙස පහත වැටුණු උද්ධමන අනුපාතිකය මගින් මෙකී වර්ධනයන් තවදුරටත් ප්‍රගුණ කරනු ලැබීය. 1983 දී සියයට 25 හා සසඳන කල පටු මුදල් සැපයුම ($M_1$) සියයට 14 කින් ඉහළ ගිය අතර, ඉකුත් වසරේ වූ සියයට 22 හා සැසඳීමේදී පුළුල් මුදල් සැපයුම ($M_2$) සියයට 17 කින් ඉහළ ගියේය.

## 1 . 4 සංඛ්‍යා සටහන
## මූල්‍ය සමස්තයන් 1980 — 1984

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1980 | 1981 | 1982 | 1983 | 1984 |
|---|---|---|---|---|---|
| දේශීය ණය වෙනස්වීම .. | 10,832 | 8,163 | 8,431 | 6,895 | 633 |
| රජයට දෙන ලද ණය (ශුද්ධ) වැඩිවීම .. | 6,052 | 3,817 | 4,361 | 383 | -2,979 |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය වැඩිවීම .. | 776 | 365 | 190 | - 292 | - 237 |
| සමුපකාර අංශයට දෙන ලද ණය වැඩිවීම .. | - 540 | - 74 | - 106 | 635 | - 255 |
| පෞද්ගලික අංශයේ අනෙකුත් ගනුදෙනුකරුවනට දෙන ලද ණය වැඩිවීම .. | 4,544 | 4,055 | 3,986 | 6,170 | 4,104 |
| බැංකු විදේශ වත්කම් (ශුද්ධ) වෙනස්වීම .. | -3,117 | - 690 | - 568 | 815 | 6,777 |
| මුළු වත්කම් සහ වගකීම් වෙනස් වීම. .. | 7,655 | 7,473 | 7,863 | 7,710 | 7,410 |
| පුළුල් මුදල් සැපයුම වැඩිවීම ($M_2$) .. | 4,803 | 4,587 | 6,063 | 6,747 | 6,170 |
| අනෙකුත් වගකීම් (ශුද්ධ) වැඩිවීම .. | 2,852 | 2,886 | 1,800 | 963 | 1,240 |

මූල්‍ය සමස්තයන් වැඩිවීම්හි ප්‍රතිශතය.

| | | | | | |
|---|---|---|---|---|---|
| මුළු දේශීය ණය වැඩිවීමේ ප්‍රතිශතය .. | 72·4 | 31·6 | 24·8 | 16·3 | 1·3 |
| මුළු වත්කම් සහ වගකීම් වැඩිවීමේ ප්‍රතිශතය .. | 35·2 | 25·4 | 21·3 | 17·2 | 14·1 |
| මුළු දේශීය ණය වැඩිවීමෙහි රජයේ කොටස ප්‍රතිශතයක් වශයෙන් .. | 55·9 | 46·8 | 51·7 | 5·6 | -470·4 |
| මුළු දේශීය ණය වැඩිවීමෙහි රාජ්‍ය නොවන කොටස ප්‍රතිශතයක් වශයෙන් .. | 44·1 | 53·2 | 48·3 | 94·4 | 570·4 |
| පුළුල් මුදල් සැපයුම වැඩිවීමේ ප්‍රතිශතය ($M_2$) .. | 31·9 | 23·1 | 24·8 | 22·1 | 16·6 |
| පටු මුදල් සැපයුම වැඩිවීමේ ප්‍රතිශතය ($M_1$) .. | 22.9 | 6·3 | 17·3 | 25·4 | 14·1 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව·

1984 දී දේශීය ණය ප්‍රසාරණ අනුපාතිකයෙහි කැපී පෙනෙන පහත වැටීමක් විය. ඉකුත් වසරෙහි වූ සියයට 16 හා සසඳන කල, දේශීය ණය ඉහළ ගියේ සියයට එකකින් පමණි. දේශීය ණය වර්ධනයෙහි වූ මෙකී සැළකිය යුතු පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, රාජ්‍ය සහ පෞද්ගලික දෙඅංශය මගින් ණය සඳහා වූ ඉල්ලුම අඩු කිරීමය.

තීරු බදු සහ ආදායම් බදු මගින් ඉහළ ගිය ආදායම හේතුවෙන් සම්පත් සැළකිය යුතු ලෙස වැඩිවීම නිසා රජය බැංකු ක්‍රමය වෙත වූ රඳා පැවැත්ම අඩු විය. විදේශ ආධාර ගලා ඒම සහ භාණ්ඩාගාර බිල්පත් හා රජයේ සුරැකුම්පත් සඳහා බැංකු නොවන මූලාශ්‍ර වෙතින් වූ ඉහළ දායකත්වයන් රජයේ සම්පත් තවදුරටත් ඉහළ නැංවීය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ඉහළ ගිය රජයේ මුදල් ශේෂ, බැංකු ක්‍රමය වෙත නොපියවා පැවති වගකීම් අඩු කිරීම සඳහා යොදා ගන්නා ලදී. මහ බැංකුවේ ලාභවලින් මහා භාණ්ඩාගාරයට දෙනු ලැබූ රුපියල් 165 කෝටිය රජයේ නොපියවා පැවති වගකීම්වලින් සමහරක් පියවා දැමීමට යෙදවිණි. මෙකී සියළුම හිතකර වර්ධනයන්හි ප්‍රතිඵලය වූයේ රජයට දෙනලද ශුද්ධ ණය සියයට 17 කින් පහත වැටීමය.

රජයේ සංස්ථා සහ සමුපකාර ආයතනද ඇතුළුවන පෞද්ගලික අංශයට දුන් ණය 1983 දී වූ සියයට 26 හා සසඳන කල, 1984 දී සියයට 11 කින් වැඩි විය. පෞද්ගලික අංශයට දුන් ණයෙහි වර්ධන වේගය පහත වැටීම, විශේෂයෙන්, වැවිලි සංස්ථා දෙක ඇතුළුව රජයේ ඇතැම් සංස්ථාවන්හි වැඩි දියුණු වූ මූල්‍ය තත්ත්වය සහ වසරේ ප්‍රථම භාගය තුළ මහ බැංකුව විසින් පනවන ලද ණය සීමාවන් හේතුවෙන් පහත වැටුණු ප්‍රමුඛතා නොවන ණය සඳහා වූ ඉල්ලුම තුළින් ප්‍රධාන

වශයෙන් පිලිබිඹු විණි. තවද, මහජන බැංකුව මගින් වී අලෙවි මණ්ඩලය සඳහා සපයනු ලබන අලෙවි ප්‍රතිමූල්‍ය ණය මත සීමාවන් පැනවීමේ හේතුවෙන් සමූපකාර ආයතන සඳහා වූ ණයද පහත වැටුණි.

රජය, බැංකු ක්‍රමය වෙත තැන්පතු සම්පත් සැපයීමේ ලා ශුද්ධ ලෙස දායක වීමේ ප්‍රශංසනීය තත්ත්වය පෞද්ගලික අංශයට (රාජ්‍ය සංස්ථා සහ සමූපකාර ආයතන අත්හැර) තවදුරටත් බැංකු සම්පත් ප්‍රයෝජනයට ගැනීමට ඉඩ හරින්නක් විය. ණය ප්‍රසාරණය කෙරෙහි පණවනු ලැබූ සීමාවන් තුළ, වාණිජ බැංකු ණය ලබා ගැනීමේ පූර්ණ ඉඩකඩ පෞද්ගලික අංශයට ලැබුණි. ඉකුත් වසරවල රජය මගින් බැංකු ක්‍රමය වෙතින් සම්පත් ඇද ගැනීමෙන් පෞද්ගලික අංශයට එකී සම්පත් ප්‍රයෝජනයට ගැනීමට තිබූ ඉඩකඩ අහිමි කරවීමට වඩා හාත්පසින් වෙනස් තත්ත්වයක් විය. රජය මගින් බැංකු සම්පත් නිදහස් කිරීම, ආර්ථික සංවර්ධනයේ ලා පෞද්ගලික අංශයේ සහභාගිත්වය දිරි ගැන්වීමේ අරමුණු සමග ගැලපේ.

වසර තුළ ක්‍රියාත්මකවූ මූල්‍ය සහ ණය ප්‍රතිපත්තීන් තුළින් ආර්ථිකයෙහි ඉහළ ගිය ද්‍රවශීලතා තත්ත්වය මධ්‍යයේ මූල්‍ය ස්ථායීතාව ලඟා කර ගැනීම මෙන්ම සංවර්ධන පරමාර්ථයන් අත්කර ගැනීම සඳහා සිතා මතා කළ ප්‍රයත්නයන් පිළිබිඹු විය. මහ බැංකු ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම තුළින් බැංකු ණය ප්‍රසාරණය අඩු කරලීමේ අදහසින් ඇතැම් පියවරයන් හඳුන්වා දෙනු ලැබීය. මේවා අතර, වී අලෙවි මණ්ඩලයට දෙනු ලබන අලෙවි ප්‍රතිමූල්‍ය පහසුකම් මත සීමා පැනවීම සහ වෙළෙඳ බැංකු වෙත වූ පොදු පහසුකම මත කරනු ලැබූ සංශෝධනයන් ද විය. මේ අතර, ආර්ථිකයේ සැපයුම් අංශය වර්ධනය කරනු සඳහා නැඹුගත කිරීමට පෙර, සැපයෙන අපනයන ණය ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාදීම තවදුරටත් සිදුකරගෙන යන ලදී. මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය පහසුකම් වෙනස්කම්වලට භාජනය විය. සම්ප්‍රදායික නොවන අපනයන සඳහා වූ සීමාවක් නොමැති ප්‍රතිමූල්‍ය පහසුකම් සම්බන්ධයෙන් අදාළ පොළී ප්‍රමාණය අඩු කිරීමක් සහිතව තවදුරටත් පවත්වා ගෙන යනු ලැබීය. අවශ්‍යතාවක් මතු වුවහොත් මෙකී පහසුකම තවදුරටත් පුළුල් කිරීමට ඉඩ කඩ සලසා තිබුණද, සම්ප්‍රදායික නොවන අපනයන කෙරේ ලබා දෙන ලද ප්‍රතිමූල්‍ය පහසුකම් වසර තුළ දී අඩු විය. අපනයන අංශයේ සතුටුදායක ක්‍රියාකාරිත්වය මගින් යහපත් අතට හැරුණු ද්‍රවශීලතා තත්ත්වය සමඟම වෙළෙඳ බැංකු විසින් පොළී ප්‍රමාණ අඩු කිරීමත් හේතු කොටගෙන පෞද්ගලික අංශය විසින් ප්‍රතිමූල්‍ය පහසුකම් ප්‍රයෝජනයට ගැනීම අඩු කෙරිණි.

අත්‍යවශ්‍ය නොවන ආනයන, විශේෂයෙන්ම පාරිභෝගික ද්‍රව්‍ය ආනයන සඳහා වූ ණය ප්‍රසාරණය සීමා කිරීම සඳහා වරණීය ණය පාලන ක්‍රම යොදා ගන්නා ලදී. එපමණක් නොව වාණිජ බැංකු මත පනවන ලද ණය සීමාවන් ශක්තිමත් කිරීමේ සහ තැන්පතු කරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීමේ අදහසින් මූල්‍ය ආයතන සඳහා බලපැවැත්වෙන ද්‍රවශීලතා අනුපාතිකය මුළු තැන්පතු වලින් සියයට 5 සිට සියයට 10 දක්වා ඉහළ නංවන ලදී.

දේශීය ද්‍රවශීලතාවයෙහි වර්ධනය මැඬලීම සඳහා, මහ බැංකුව විසින් විශේෂ ක්‍රම දෙකක් අනුගමනය කරන ලදී. 1984 ජූනි මස සිට ක්‍රියාත්මක වන පරිදි, මහ බැංකුව ස්වකීය සුරැකුම්පත් නිකුත් කළ අතර, එමගින් බැංකු සහ බැංකු නොවන මූලාශ්‍ර වෙතින් රුපියල් 55 කෝටි 70 ලක්ෂයක මුදලක් ලබා ගන්නා ලදී. වෙළෙඳ බැංකුවල ණය මැවීමේ හැකියාව සීමා කරමින්, ක්‍රමයෙන් වැඩිවෙන පරිමාණයක් යටතේ ආන්තික සංචිත අවශ්‍යතා හඳුන්වා දීම මගින් මෙම පියවර තවදුරටත් ශක්තිමත් කරනු ලැබිණි.

මූල්‍ය අංශයේ සැළකිය යුතු ප්‍රගතිය තවදුරටත් පූර්ණ වූයේ මුදලේ සංසරණ ප්‍රවේගය අඩු වීමෙනි. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ලද රාජ්‍ය මූල්‍ය සහාය, විශේෂයෙන්ම බැංකු අංශය වෙතින් රජයේ ණය ගැනීම අඩුකර ලීමෙන්, උද්ධමන අනුපාතිකය අඩුවීම කෙරෙහි විශාල මෙහෙයක් ඉටු කරන ලදී.

මහ බැංකුවේ පොළී අනුපාතික ප්‍රතිපත්තියෙහි සිදුකරන ලද ප්‍රතිශෝධන, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පොළී ප්‍රමාණ ප්‍රතිපත්තිය කෙරෙහි බලධාරීන්ගේ මැදිහත් නොවීම, සහ වෙළෙඳ බැංකු විසින් අත් දකිනු ලැබූ අධි ද්‍රවශීල තත්ත්වයන් හේතුවෙන් පොළී අනුපාතික ව්‍යුහය වසර තුළ වෙනස්කම් කිහිපයකට භාජනය විය. 1984 ජූලි මාසයේදී ජාතික ඉතිරි කිරීමේ බැංකුව ස්වකීය එක් අවුරුදු ස්ථාවර තැන්පතු අනුපාතිකය ප්‍රතිශත අංක දෙකකින් අඩු කරන ලදී. වෙළෙඳ බැංකු ද විවිධ අවස්ථාවන්හිදී එකිනෙකට වෙනස් ප්‍රතිශතවලින් තැන්පතු අනුපාතිකයන් අඩු කරනු ලැබීය. ඇතැම් බැංකු මගින් කරනු ලැබූ සුළු සංශෝධනයන් හැරුණු විට, සාමාන්‍යයෙන්, ණය දීමේ පොළී අනුපාතිකයන් නොවෙනස්ව පැවතියේය. උද්ධමන අනුපාතිකය සහ උද්ධමනකාරි පීඩනයන් අඩුවීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් තැන්පතු කරුවන්ට ධන මූර්ත පලදාවක් ලැබීම හේතුකොටගෙන පොළී ප්‍රමාණ ව්‍යුහය වෙනස්කම්වලට භාජනය වන තත්ත්වයක් පැවැතිය යුතුය.

ග්‍රාමීය අංශයට ප්‍රමාණවත් ලෙස ණය නොසැපයීම පිළිබඳව මහ බැංකුවේ අවධානය පසුගිය වාර්ෂික වාර්තාවලින්ද ප්‍රකාශ කරනු ලැබිණි. ප්‍රතිශත ස්වරූපයෙන් ඉදිරිපත් කිරීම හේතුකොටගෙන ග්‍රාමීය ණය යෝජනා ක්‍රම යටතේ වූ නියම තත්ත්වය නිසි ආකාරයකින් නොදක්වේ. සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ වී සහ අනෙකුත් ආහාර භෝග සඳහා දුන් ණය 1984 දී රුපියල් 21 කෝටි 70 ලක්ෂයක් වූ අතර, එය 1983 ප්‍රමාණයට වඩා රුපියල් 3 කෝටි 60 ලක්ෂයකින් නැතහොත් සියයට 20 කින් ඉහළ යාමක් පෙන්නුම් කරයි. පෞද්ගලික අංශය සඳහා වූ මුළු ණය ප්‍රසාරණය හා සසඳන කල මෙය සුළු වැඩිවීමකි. මෙවැනි ණය දීමේ මට්ටමක් අනුව බලන කල, ග්‍රාමීය කෘෂිකාර්මික අංශයේ මුළු ණය අවශ්‍යතාවලින් ඉතා සුළු ප්‍රමාණයක්වත් සපුරාලීමට බැංකු ක්‍රමය අපොහොසත් වී ඇති බව පෙනේ. දිවයිනෙහි මෙතෙක් පැවති ග්‍රාමීය ණය වර්ධනය කිරීමේ ප්‍රයත්නයන් බොහෝ දුරට වගා ණය කෙරෙහිම අවධානය යොමු කිරීමද සඳහන් කළ යුතු කරුණකි. සංවර්ධනය සඳහා බැංකු මූල්‍ය පහසුකම් අවශ්‍ය කැරෙන කාර්යයන් රාශියක් භෝග වගාවන්ට අමතරව, ග්‍රාමීය අංශයේ ඇත.

මුදල් වෙළෙඳපොළෙහි පැවති අධි ද්‍රවශීලතාව මධ්‍යයේ වුව ද, ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි වූ ගනුදෙනු ආකර්ශවත් නොවීය. මෙමගින්, මුදල් වෙළෙඳපොළ අරමුදල්, ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙත මාරු කිරීම සඳහා අවශ්‍ය මාර්ග සීමිත බව සහ ආයතනික රාමුවෙහි පැවති අඩුපාඩුවද මතු කර පෙන්විය.

රාජ්‍ය මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් 1983 වර්ෂය තුළදී අත්කර ගත් සැළකිය යුතු වර්ධනය, 1984 දී තවදුරටත් ශක්තිමත් කරගන්නා ලදී. ආදායම එකතුකිරීම සීඝ්‍ර අන්දමින් වැඩිවීමත්, රජයේ වියදම්වල ඌන වර්ධනයත්, අයවැය පරතරය සෑහෙන අන්දමින් අඩුකරලීමට හේතු විය. දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ගත් කළ අයවැය පරතරය 1983 වර්ෂය තුළ පැවති සියයට 18 සිට 1984 වර්ෂයේදී සියයට 11 දක්වා පහත වැටුණි. අයවැය ඉතිරි කිරීම් සතුටුදායක මට්ටමක පැවතීම දේශීය ඉතිරිකිරීම් වර්ධනය කිරීමට පිටුවහලක් විය. ඇත්ත වශයෙන්ම, අයවැය ඉතිරි කිරීම්වල වැඩිවීම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4 ක් පමණ වූ අතර, එය දේශීය ඉතිරි කිරීම්වල වර්ධනයෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් නියෝජනය කළේය.

1984 වර්ෂය තුළදී රජයේ මුළු ආදායම සියයට 50 කින් ඉහළ ගීය අතර, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ගත් කල එය සියයට 21 සිට සියයට 25 දක්වා වැඩි වී ඇත. වර්ෂය තුළදී ආදායම් එක්රැස් කිරීමෙහි ලා දැරූ ප්‍රයත්නයන් වඩාත් ශක්තිමත් කෙරිණි. අය බදු නොගන්නා මූලයන්ගෙන් ආදායම් ලබා ගැනීම වැඩි කෙරිණි. වියදම් අංශයේ වැඩීම සීමා කිරීම පිණිස, වියදම් කපා හැරීම් හා රාජ්‍ය අංශයේ සංස්ථාවල ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීමට පියවර ගන්නා ලදී. කෙසේ වුවද, වියදම් කපා හැරීමේ ක්‍රියාමාර්ගවලින් අත්කර ගන්නා ලද වාසිය, පරිපූරක වියදම් මගින් උද්ගත වූ පීඩන නිසා අහෝසි විය. සමස්ත වියදම 1984 දී සියයට 14 කින් වැඩි වූ අතර, 1983 දී එය සියයට 24 කින් වැඩි විය.

## 1.5 සංඛ්‍යා සටහන

### රාජ්‍ය මූල්‍ය කටයුතුවල පිළිබඳ සංඛ්‍යා 1980 — 1984

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1980 | 1981 | 1982 | 1983(අ) | 1984(අ) |
|---|---|---|---|---|---|
| ආදායම .. | 14,068 | 16,228 | 17,809 | 25,210 | 37,731 |
| වියදම .. | 30,343 | 31,094 | 37,900 | 46,816 | 53,593 |
| පුනරාවර්තන වියදම | | | | | |
| අත්තිකාරම් ගිණුම් ඇතුළුව .. | 16,489 | 17,721 | 19,231 | 25,083 | 31,843 |
| වර්තන ගිණුමේ හිඟය (−) අතිරික්තය (+) .. | −2,421 | −1,493 | −1,422 | +127 | +5,888 |
| ප්‍රාග්ධන වියදම .. | 13,854 | 13,373 | 18,669 | 21,733 | 21,750 |
| සමස්ත අයවැය හිඟය .. | 16,275 | 14,866 | 20,091 | 21,606 | 15,862 |
| පියවීම | | | | | |
| විදේශීය .. | 6,735 | 8,208 | 8,794 | 10,950 | 11,226 |
| දේශීය බැංකු නොවන .. | 2,484 | 2,779 | 7,607 | 10,147 | 6,601 |
| දේශීය බැංකු .. | 7,126 | 3,917 | 4,006 | 1,203 | −2,644 |
| මුදල් ශේෂ භාවිතය .. | −72 | −38 | −315 | −694 | 679 |
| **දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස** | | | | | |
| ආදායම .. | 21·1 | 19·1 | 17·9 | 20.7 | 24.9 |
| වියදම .. | 45·6 | 36.6 | 38.0 | 38·5 | 35.4 |
| පුනරාවර්තන වියදම | | | | | |
| අත්තිකාරම් ගිණුම් ඇතුළුව .. | 24.8 | 20·8 | 19.3 | 20.6 | 21.0 |
| වර්තන ගිණුම් | | | | | |
| හිඟය (−) / අතිරික්තය (+) .. | −3·6 | −1·8 | −1·4 | +0·1 | +3·9 |
| ප්‍රාග්ධන වියදම .. | 20·8 | 15·7 | 18.7 | 17·9 | 14·4 |
| සමස්ත අයවැය හිඟය .. | 24.5 | 17.5 | 20.1 | 17·8 | 10·5 |
| පියවීම | | | | | |
| විදේශීය .. | 10·1 | 9.7 | 8.8 | 9.0 | 7.4 |
| දේශීය බැංකු නොවන .. | 3·7 | 3.3 | 7.6 | 8·3 | 4.4 |
| දේශීය බැංකු .. | 10·7 | 4.6 | 4·0 | 1·0 | −1·7 |
| මුදල් ශේෂ භාවිතය .. | −0·1 | ... | −0.3 | −0.6 | 0.4 |

මූලයන්: මහා භාණ්ඩාගාරය, ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) තාවකාලික

අයවැය පරතරය මූල්‍යකරණය සඳහා රජය විසින් විදේශ සම්පත් සැළකිය යුතු ප්‍රමාණයක් උපයෝගී කරගන්නා ලදී. අයවැය හිඟයේ විදේශ මූල්‍යකරණය 1983 දී වූ සියයට 51 සිට 1984 දී සියයට 71 දක්වා වැඩි විය. එසේ වුව ද, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ගත් කල විදේශවලින් ලද සම්පත් සියයට 9 සිට සියයට 7 දක්වා පහත වැටිණි. තවද, බැංකු නොවන දේශීය මාර්ගයන්ගෙන් අඩු මට්ටමක සම්පත් රජය විසින් ලබා ගන්නා ලදී. මේ අනුව, 1977 න් පසුව, ප්‍රථම වතාවට අවශ්‍ය සම්පත් පරතරයට වඩා බෙහෙවින් අධික සම්පත් ප්‍රමාණයක් එක්රැස් කිරීමට එකී මූල්‍යකරණ ප්‍රයත්නයන්ට හැකි විය. බැංකු පද්ධතියට ගෙවීමට තිබූ ණය කොටසක් ආපසු ගෙවීම සඳහා එකී අතිරික්තය යොදා ගැනුණි.

1984 දී ජාත්‍යන්තර ආර්ථික වාතාවරණයේ දක්නට ලැබූ දියුණුව, ඛණිජ තෙල් සම්පත් නොමැති දියුණු වෙමින් පවත්නා රටවලට හිතකර විය. ඇමෙරිකා එක්සත් ජනපදයේ සිදු වූ වේගවත් ආර්ථික උද්දීපනය, ලොව පුරා නිෂ්පාදන ප්‍රගතියකට තුඩු දෙන ලදී. එහෙත් සමස්ත ලෝක ආර්ථික උද්දීපනය අසමාන තත්ත්වයක පැවතිණි. දියුණු කාර්මික රටවල්වලින් එක්සත් ජනපදය හැරුණු විට, ජපානය සහ කැනඩාව තුළ පමණක් තරමක ඉහළ වර්ධන

අනුපාතිකයක් වාර්තා විය. යුරෝපීය ආර්ථිකයන් බොහොමයක්ම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මගින් පනවන ලද සීමා කිරීම් සහ අසහනකාරී ශ්‍රම වෙළෙඳපොළ නිසා පීඩාවට පත්විය. එක්සත් ජනපදය වෙත ප්‍රාග්ධන ගලායෑම් නිසා, මෙම රටවල්හි මූල්‍ය ප්‍රතිපත්ති දැඩි පීඩනයට හසුවී තිබුණි. එහෙත්, වර්ෂයේ තෙවැනි කාර්තුව තරමේදී, එක්සත් ජනපද පොළී අනුපාතිකයන්හි මඳ වශයෙන් පහළ යාමක් දක්නට ලැබුණි. වර්ෂය මැද වන විට, බොර තෙල් මිළ ස්ථිරව තිබුණේ වුව ද, එය තවත් පහළ මට්ටමකට වැටීමේ තර්ජනයන්ට අසුවී තිබිණි. එක්සත් ජනපද ඩොලර් මිළ අනුව ගත් කල, ඛනිජ තෙල් නොවන භාණ්ඩ මිළ වර්ෂය මුලදී මුදුන් මට්ටමට ළඟා වූ නමුදු, වර්ෂයේ තෙවැනි කාර්තුවේ දී පමණ තරමක් පහත වැටුණි. කාර්මික රටවල් බොහොමයකම උද්ධමනය අඩු වූ අතර, එහි සාමාන්‍යය සියයට 5 ක් තරම් විය. එසේ වුවද, උද්ධමනයේ එම අඩුව ලබා ගන්නා ලද්දේ අධික රැකියා වියුක්තියක් සහිතවය. කාර්මික රටවල්වල ඉහළ යන රැකියා වියුක්ති තත්ත්වය, ආරක්ෂක පියවරවල් තවත් තර කිරීමට තුඩු දෙනු ලැබූ අතර, එමගින් ලෝක වෙළෙඳාමෙහි වඩාත් අධික ප්‍රසාරණයකට ඇති ඉඩ ප්‍රස්ථා අහුරනු ලැබීය. එසේ වුව ද, දියුණු වෙමින් පවත්නා රටවල් බොහොමයකටම සිය සමස්ත ගෙවුම් තුලන තත්ත්වයන්හි වර්ධනයක් ඇතිකර ගැනීමෙහි ලා 1984 වර්ෂයේ දී ලෝක වෙළෙඳාමේ දක්නට ලැබුණු තියුණු උද්දීපනය ඉවහල් විය.

මෙම ජාත්‍යන්තර වෙළෙඳාමේ වර්ධනයන් ශ්‍රී ලංකාවට ද වාසිදායක විය. වෙළෙඳ භාණ්ඩ මිළ ඉහළ යාමත්, ප්‍රධාන ආනයන ශීර්ෂ කීපයකම මිළ පහත වැටීමත්, හේතු කොට ගෙන ශ්‍රී ලංකාවේ වෙළෙඳ ශේෂය මීට වසරකට ඉහත පැවති සියයට 16 ක වැඩිවීම අනුව යමින් සියයට 14 කින් වර්ධනය විය. මෙහි ප්‍රතිඵලය වූයේ, මූර්ත ජාතික ආදායම තවදුරටත් සියයට 7.6 කින් ඉහළ යාමයි. (වෙළෙඳ ශේෂයෙහි වෙනස්වීම සඳහා මූර්ත දළ ජාතික නිෂ්පාදිතය ගැලපුම් කළ පසුව).

1984 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලන ක්‍රියාකාරිත්වය ඉතාමත් වාසිදායක විය. මෙය, ප්‍රධාන වශයෙන් වෙළෙඳ භාණ්ඩ අලෙවි කටයුතු වල වර්ධනයෙහි පිළිබිඹුවක් විය. වෙළෙඳ ශේෂය කෙරෙහි ප්‍රධාන බලපෑම ඇති වූයේ, තේ අපනයනයන්ගෙන් වූ අතර, එය විගැහි අනුව සියයට 90 කින් වැඩි විය. මෙය, අපනයනයන්ගේ මුළු වටිනාකමින් සියයට 42 කි. තේ, රබර් සහ පොල් අපනයනයන්ගෙන් ලත් ඒකාබද්ධ ඉපැයීම් විගැහි 29 කෝටි 10 ලක්ෂයක් විය. එසේ වුවද, ගෙවුම් ශේෂයෙහි පැවති ආවේනික දුර්වලතාවයන් තවදුරටත් එසේම පැවතුණි. රබර් සහ පොල් සම්බන්ධයෙන් සලකන කල, වෙළෙඳපොළෙහි පැවති අධික මිළ ගණන්වලින් සම්පූර්ණ ප්‍රයෝජනය ගැනීමට ශ්‍රී ලංකාව අපොහොසත් වූයේ නිෂ්පාදනයේ පැවති පසුබෑම් නිසාවෙනි. රබර් අපනයන සියයට 0.8 කින් පමණක් වැඩිවූ අතර, පොල් අපනයනයන්හි ගෙඩි ප්‍රමාණය සියයට 44 කින් පහත වැටුණි. සුළු කෘෂි භෝග අපනයන නොකඩවා පහත වැටීම තවත් අහිතකර ලක්ෂණයක් විය. මෙම උප අංශය යලි පණ ගැන්වීම සඳහා පළදායී ප්‍රතිකර්ම යෙදීම ඉතා අවශ්‍යය. පසුගිය අවුරුදු කිහිපය තුළ දිගටම පහත වැටුණු මැණික් අපනයනය සම්බන්ධයෙන් ද කිව යුත්තේ මෙයමය. රෙදිපිළි හා මසා නිම කළ ඇඳුම් සහ වෙනත් කාර්මික භාණ්ඩ අපනයන විශාල ලෙස වැඩිවීම,වෙළෙඳාම සම්බන්ධයෙන් සිදුවූ වඩා දිරි ගන්වන සුළු ලක්ෂණයකි.

1983 දී විගැහි අනුව සියයට එකකින් පහත වැටුණු මුළු ආනයන වියදම 1984 දී සියයට 1.7 කින් වැඩි විය. මේ අනුව, පසුගිය දෙවර්ෂයේ ආනයන වර්ධනය ඉතා සුළු විය. පහත වැටුණු තෙල් සහ සීනි මිළ හා සහලින් ස්වයංපෝෂිත වීමට ආසන්න වීම ප්‍රධාන වශයෙන් ආනයන වියදම ඉකුත් වසරට වඩා සෙමින් වැඩීමට හේතු විය. 1983 දී සියයට 21 ක් වූ ආධාර යටතේ කළ ආනයන ප්‍රමාණය, 1984 දී සියයට 22 දක්වා ඉහළ නැගුණි. ජාත්‍යන්තර ආධාර කෙමෙන් අඩුවීමත් සමග ආධාර මගින් කෙරෙන ආනයන, මෙම මට්ටමේන් තබා ගැනීමට ශ්‍රී ලංකාවට නොහැකි වනු ඇත. එහෙයින්, අපනයන ඉපයීම් වැඩි කිරීමේ සහ කාර්යක්ෂම ආනයන ආදේශන ඇති කිරීමේ ක්‍රියාමාර්ග සඳහා ඉහළම ප්‍රමුඛත්වය හිමිවිය යුතුය.

### 1 . 6 සංඛ්‍යා සටහන
### සංක්ෂිප්ත ගෙවුම් තුලනය 1982 - 1984

රුපියල් දශ ලක්ෂ (විගැහි දශ ලක්ෂ වරහන් තුළ)

| ශීර්ෂය | 1982 (අ) | 1983 (අ) | 1984 (ආ) |
|---|---|---|---|
| වෙළෙඳ භාණ්ඩ අපනයන .. | 21,098 | 25,038 | 37,453 |
| | (918) | (993) | (1,439) |
| වෙළෙඳ භාණ්ඩ ආනයන .. | 41,501 | 45,206 | 47,626 |
| | (1,808) | (1,794) | (1,825) |
| සාධක නොවන සේවා (ශුද්ධ) .. | 1,645 | 1,803 | 1,798 |
| | (72) | (73) | (68) |
| සාධක සේවා (ශුද්ධ) .. | – 1,959 | – 3,214 | – 3,356 |
| | (– 85) | (– 129) | (– 128) |
| පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) .. | 5,494 | 6,441 | 7,039 |
| | (240) | (256) | (270) |
| නිල සංක්‍රාම (ශුද්ධ) .. | 3,379 | 4,016 | 3,903 |
| | (147) | (160) | (150) |
| ජංගම ගිණුම් ශේෂය .. | – 11,844 | – 11,122 | – 789 |
| | (– 516) | (– 441) | (– 26) |
| සමස්ත ශේෂය .. | – 1,009 | +342 | +7,062 |
| | (– 18) | (+0.6) | (+297) |

වැදගත් දත්ත කීපයක්

| | | | |
|---|---|---|---|
| වෙළෙඳ අනුපාතය (1978=100) .. | 38 | 44 | 50 |
| ඛනිජ තෙල් ආනයන (ශුද්ධ) .. | 8,994 | 8,342 | 7,393 |
| | (391) | (332) | (284) |
| ද. දේ. නි. යේ ප්‍රතිශතයක් වශයෙන් ජංගම ගිණුම් ශේෂය .. | 11·8 | 9·1 | 0·5 |
| දළ ජාත්‍යන්තර සංචිත .. | 11,234 | 13,026 | 18,942 |
| | (478) | (499) | (735) |
| දළ ජාත්‍යන්තර සංචිතයේ ආනයන ධාරිතාව (ආනයන මාසවලින්) (ඇ) .. | 3.2 | 3.2 | 4·5 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) විගැහි අනුව ඉදිරි වර්ෂයේ ආනයන සඳහා ගණන් බලා ඇත.

ගෙවුම් තුලනයෙහි වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිඟය පසුගිය වර්ෂයේ රුපියල් 2,016 කෝටි 80 ලක්ෂයේ (විගැහි 80 කෝටි 10 ලක්ෂයේ) සිට රුපියල් 1,017 කෝටි 30 ලක්ෂය (විගැහි 38 කෝටි 60 ලක්ෂය) දක්වා ඉතා සීඝ්‍ර ලෙස පහත වැටුණි. මෙය, සියයට 50 කට වඩා වැඩි වූ සැහෙන පහත වැටීමකි. සේවා ගිණුමෙහි හිඟය 1983 ට වඩා අඩු පරිහානියක් පෙන්විය. මෙම හිඟය ප්‍රධාන වශයෙන්ම, විදේශ ණය සම්බන්ධයෙන් වැඩි වූ පොළී ගෙවීම් මෙන්ම සංචාරක අංශයේ ලැබීම් සුළු වශයෙන් පහත වැටීමද (විගැහි අනුව) නිසා සිදු විය. කෙසේ වුව ද, 1984 දී විදේශ වත්කම් ක්‍රමයෙන් ගොඩනැගීම නිසා, මේ සාධක මගින් වූ ඌන බලපෑම ඉහළ මට්ටමේ පොළී ලැබීම් නිසා විශාල අන්දමින් මග හැරුණි.

1984 දී ජංගම ගිණුම් හිඟය කැපී පෙනෙන අන්දමින් පහත වැටුණි. ආධාර වශයෙන් ලද ප්‍රධාන සහ පිටරට රැකියාවන්හි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගෙන් ලද විදේශ ප්‍රේෂණ, භාණ්ඩ හා සේවා හිඟය මකා දැමීමට ආසන්න වශයෙන් සැහුණි. මෙහි ප්‍රතිඵලය වූයේ ජංගම ගිණුම් හිඟය විගැහි දෙකෝටි 60 ලක්ෂයක් පමණක් වීමය. නිල සංක්‍රාම පසුගිය වර්ෂයට වඩා සුළු වශයෙන් අඩු වූ අතර, පෞද්ගලික සංක්‍රාම (ප්‍රධාන වශයෙන් සේවක ප්‍රේෂණ) සියයට 5 කින් වැඩි විය. පහත වැටුණු තෙල් මිළ සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් මැද පෙරදිග රටවල් සිය

වියදම් කපා හැරීම නිසා, සේවක ප්‍රේෂණ වැඩිවීම එලෙසම පවත්වා ගැනීමේ බලාපොරොත්තු හීන බව පෙනේ. එහෙයින්, ගෙවුම් තුලනයෙහි මැදි කාලීන දියුණුවක් ලැබිය හැක්කේ මීට වඩා යහපත් ශේෂයකින් යුත් වෙළෙඳ භාණ්ඩ ගිණුමක් මගිනි.

1983 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 9.1 ක්ව පැවතුණු ජංගම ගිණුම් හිඟය, 1984 දී සියයට 0.5 ක් දක්වා පහත වැටුණි. රුපියල් 390 කෝටි 30 ලක්ෂයක් (විගැහි 15 කෝටියක්) වූ නිල සංක්‍රාම අත්හළ විට, මෙම අනුපාතය පසුගිය වර්ෂයේ සියයට 12.4 වූ අතර මේ වර්ෂයේ එය සියයට 3.1 ක් විය. විශේෂයෙන්ම, විදේශ ණය සේවා ගෙවීම් වැඩිවන අතරම, මහවැලි ව්‍යාපාරයට සම්බන්ධ ආධාර අඩු වීමෙන් විදේශ ආධාර ගලාඒම අඩු මට්ටමක රැඳීමක් බලාපොරොත්තු විය හැකි බැවින්, මෙම ගෙවුම් ශේෂ තත්ත්වය පවත්වා ගැනීම සඳහා ප්‍රයත්න දැරිය යුතුය.

භාණ්ඩ හා සේවා හිඟයෙන් සියයට 95 කට ආසන්න ප්‍රමාණයක්, පෞද්ගලික හා නිල සංක්‍රාම වශයෙන් විදේශ විනිමය ශුද්ධ ගලා ඒම මගින් පියවුණි. මේ නිසා මූල්‍ය නොවන ප්‍රාග්ධන ගලාඒම මගින් පියවිය යුතු ජංගම ගිණුමේ හිඟය ඉතා සුළු විය. කෙසේ වුව ද, මූල්‍ය නොවන ප්‍රාග්ධනය ගලාඒම වර්තන ගිණුමේ හිඟයට වඩා බොහෝ වැඩි විය. එහි ප්‍රතිඵලය සමස්ත අතිරික්තය වැඩි වීමයි. 1983 වර්ෂයේ විගැහි හය ලක්ෂයක් වූ සමස්ත අතිරික්තය හා සසඳන කල එය, 1984 දී විගැහි 29 කෝටි 70 ලක්ෂයක් විය. වර්ෂය අවසාන වන විට දළ විදේශ වත්කම් මට්ටම සියයට 47 කින් වැඩිවී රුපියල් 1894 කෝටි 20 ලක්ෂයක් (විගැහි 73 කෝටි 50 ලක්ෂයක්) විය. මෙය 1985 වර්ෂයේදී සිදුකිරීමට බලාපොරොත්තු වූ මාස හතරහමාරක ආනයන වියදම පියවීමට සෑහුණි.

මෑත කාලයේ විදේශ ණය වර්ධනයෙහි ඇති උපනතිය ඉතා කණස්සළු දනවන සුළු වූයේ ගෙවුම් තුලන කළමණාකරනයේදී එහි ඇති ප්‍රතිවිපාක හේතුකොට ගෙනය. ණය කළමණාකරන සලකා බැලිය යුතු වන්නේ, ගෙවුම් තුලන තත්ත්වයට පාදක වූ උපනතීන් හා ආර්ථික වර්ධනයෙහිලා දීර්ඝ කාලීන වශයෙන් සැලකෙන ඉඩ ප්‍රස්ථාවන් අනුවය. එම නිසා දැනට ආරම්භ කොට ඇති වෙළෙඳ ණය ගැනීම් අධෛර්යමත් කරවන සුළු වන්නාවූත්, අපනයන නගා සිටුවන සහ කාර්යක්ෂම ආනයන ආදේශනය ඇති කරවන්නාවූත් ප්‍රතිපත්ති කාලෝචිත ය.

කෙටි කාලීන ණය විශාල වශයෙන් පහත වැටීම, 1984 දී ණය ප්‍රතිරූපයේ දක්නට ලැබුණු වැදගත් වෙනස විය. එමනිසා, මහ බැංකුවේ විදේශීය ණය ගැනීම් 1983 දී විගැහි හත් කෝටි 20 ලක්ෂයේ සිට 1984 දී විගැහි පන් ලක්ෂය දක්වා අඩු විය. ණය ප්‍රතිරූපය යහපත් අතට හරවනු ලැබූ තවත් සාධකයක් නම්, අධික පිරිවැයෙන් යුත් වාණිජමය ණය ගැනීම් පහත වැටීමය. ණය ප්‍රතිරූපයේ ඇති වූ වෙනසේ සහ අපනයන ප්‍රගතියේ ප්‍රතිඵලයක් වශයෙන් ණය සේවා ගෙවීම් සහ අපනයන අතර අනුපාතිකය 1983 දී සියයට 22 සිට 1984 දී සියයට 17 දක්වා අඩු විය.

1984 දී බලශක්ති අංශයේ සෑහෙන ප්‍රගතියක් දක්නට ලැබිණි. ලෝක ඛනිජ තෙල් මිළ ගණන් පහත වැටීම, දැනට ස්ථාපිත විදුලිය බල ධාරිතාවයෙහි සීඝ්‍ර වැඩිවීම සහ ජල විදුලිය බලය නිපදවීමට උචිත කාලගුණික තත්ත්වයන් පැවතීම, එකී වැඩි දියුණුවට අදාළ වූ ප්‍රධාන සාධකයන් විය. ජල විදුලිය බල සම්පාදනය වැඩිදියුණුවීම නිසා විදුලිය නිෂ්පාදනයෙහි ලා ඛනිජ තෙල් භාවිතය සැළකිය යුතු පරිදි වර්ෂය තුළදී අඩු විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ශුද්ධ ඛනිජ තෙල් ආනයන සැළකිය යුතු ලෙස පහත වැටීමෙන් ගෙවුම් තුලනය කෙරෙහි හිතකර බලපෑමක් ඇති විය. එහෙත්, බලශක්ති බෙදා හැරීමේ කාර්යක්ෂමතාවය සහ යෝග්‍ය පරිදි ඉල්ලුම් පාලනය කිරීම කෙරෙහි එල්ල කරන ලද ප්‍රතිපත්තිමය තීරණයන් යථෝක්ත වාසිදායක තත්ත්වයන් හේතුකොට ගෙන අඩපණ නොකළ යුතුය.

සමස්තයක් වශයෙන් සලකන කල, 1984 දී වූ ආර්ථික වර්ධනය දිරි ගන්වන සුළුවිය. අංශ කීපයකින්ම අත්කරගත් ජයග්‍රහනයන් අපේක්ෂිත තත්ත්වයන් ද ඉක්මවීය. එසේ වුව ද, වර්ෂය තුළදී සිදුවූ විකාශනයන්ගෙන් නැවතත් පිළිබිඹු කරනු ලැබූයේ ආර්ථිකයේ වූ ආවේනික දුර්වලතාවයයි. නොකඩවා පැවති නියඟයෙන් හා 1983 දී වූ පසුබෑමෙන් අත්මිදීමත් වෙළෙඳ ශේෂයේ වාසිදායකත්වයෙන් ආදායම් තත්ත්වයේ අත්කරගත් වැඩි දියුණුවත් ඉහළ ආර්ථික වර්ධනයකට හේතු විය. කෘෂිකාර්මික අංශයේ උප අංශයක් වන තේ, ආර්ථිකයේ නැගීමට විශාල වශයෙන් වගකීය. ගෙවුම්තුලනයේ ජංගම ගිණුමේ හිඟය, 1983 ට වඩා සැළකිය යුතු ලෙස අඩු වුව ද, එය වෙළෙඳ භාණ්ඩ ගිණුමේ අධික මට්ටමේ ඇති හිඟයේ බලපෑමට නතුවේ. ඒ අන්දමින් ආවේනිකව පවත්නා දුර්වලතාවයන් නිසා, 1984 දී දක්නට ලැබුණු ශක්තිමත් සහ දියුණු වූ ගෙවුම් තුලන තත්ත්වයන් තවදුරටත් නොපැවතීමට ඉඩ තිබේ.

ජාත්‍යන්තර ආර්ථික වතාවරණයේ ඇතිවී තිබෙන අළුත්ම විකාශනයන්ගෙන් ලෝක වෙළෙඳාමේ වැඩිවීමේ වේගය ඒ අන්දමටම පවත්වාගෙන යා නොහැකි බව පෙනී යයි. ඛනිජ තෙල් සම්පත් නොමැති, එහෙත් වෙළෙඳ භාණ්ඩ අපනයනය කරන රටවල්වල වෙළෙඳ අනුපාතය ඉදිරි වර්ෂවලදී අඩුවීමට හැකි බව භාණ්ඩ මිළ ප්‍රක්ෂේපනයන්ගෙන් පෙනී යයි. කාර්මික රටවල්වලින් සිය කර්මාන්තයන්හි ආරක්ෂාව සඳහා කරන බලපෑම් වැඩිවන බව පෙනෙන්නට ඇති අතර, මේ නිසා සංවර්ධනය වෙමින් පවත්නා රටවල්වල නිෂ්පාදන අලෙවිය පිළිබඳව තවත් ගැටළු හටගැනීමට ඉඩ ඇත. ජාත්‍යන්තර ණය අර්බුදය හමුවේ, විදේශ ආධාර සහ ණය ලබාගැනීමේ හැකියාව පසුගිය කාලයට වඩා අඩු විය හැකි ය. මෙකී කරුණු ගැන සළකා බලන කල මෑතකදී ආර්ථික වශයෙන් ලබා ඇති දියුණුව ඒ මට්ට-මින්ම පවත්වාගෙන යැමටත්, දැනට වඩා වේගවත් ආර්ථික සංවර්ධනයක් කරා ලඟා වීමටත් ශ්‍රී ලංකාවට අති මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවනවා ඇත. එහෙයින්, අපනයන වැඩි කිරීමට හා කාර්යක්ෂම ලෙස ආනයන ආදේශන කිරීම කෙරෙහිත් දැඩි ප්‍රයත්නයක් දැරීමේ පිළිවෙතක් තවදුරටත් අනුගමනය කළ යුතුය.

කෘෂිකාර්මික සහ කර්මාන්ත යන ප්‍රධාන ක්ෂේත්‍රවල ව්‍යුහාත්මක වෙනස්කම් සිදුකිරීම මැදිකාලීන වශයෙන් අපේක්ෂිත වර්ධන අරමුණු සම්බන්ධයෙන් මූලික වේ. අයවැය ප්‍රතිසංස්-කරණ සහ ඉල්ලුම් කළමණාකරනය හා බැඳුණ මූල්‍ය හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සංයුතියක් අවශ්‍ය බව අවධාරණයෙන් සඳහන් කිරීම සුදුසුය.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වර්ධනය සඳහාත් විවිධාංගීකරණය සඳහාත් සැළකිය යුතු අන්දමේ හැකියාවක් ඇත. නිවැරදිව ප්‍රතිපත්ති සම්පාදනයෙන් සහ ඒවා සාර්ථකව ක්‍රියාත්-මක කිරීමෙන් මෙම හැකියාව නිසි පරිදි ප්‍රයෝජනයට ගත හැක. වතු වගා අංශය නැවත පණ ගන්වාලීමේ රජයේ අරමුණ රජයට අයත් වතු සඳහා පිළියෙළ කරනු ලැබුවා වූ දිගුකාලීන ආයෝජන වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට ඇති කැපවීම තුළින් මනාව පිළිබිඹු වේ. ප්‍රධාන භෝග වගාවන් වන තේ, පොල්, සහ රබර් සඳහා ස්ථායීකරණ අරමුදල් පිහිටුවීම යෝග්‍ය පියවරකි.

වතු වගා අංශයෙන් ලැබිය හැකි පලදාව සහ සැබැවින් ලැබෙන පලදාව අතර සැහෙන ප්‍රමාණයක පරතරයක් දිගටම පවතින බව පෙනේ. එය, වහා අවධානයට ලක්විය යුතු කරුණක් වන්නේය. වතු වගාව පිළිබඳ උප අංශයේ දිගු කාලීන පැවැත්ම තහවුරු කිරීම්වස්, මෙකී පලදාවේ වෙනස්කම් අඩුකරලීම අවශ්‍ය වන්නේය. පවතින ආර්ථික ක්‍රමය ශක්තිමත් කිරීම දැඩි වශයෙන් අපනයන වෙළෙඳපොළ හා බැඳුනු මෙම ක්ෂේත්‍රවල ක්‍රියාකාරිත්වය මත ප්‍රධාන වශයෙන් රැඳේ. එමනිසා, රජයට හා පෞද්ගලික යන දෙඅංශයට අයත් වතුවල පලදායීතාව වැඩි දියුණු කිරීමක් අවශ්‍ය වේ. සම්ප්‍රදායික තේ වතු වගා අංශයේ පුනරුත්ථාපනය සහ පරිපාලනමය වැඩි දියුණු කිරීම අපනයන තරඟකාරිත්වය වැඩිකරලීම සඳහා ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාව තවමත් සම්ප්‍රදායික තේ පිළිබඳ ප්‍රධාන නිෂ්පාදකයෙක් වේ. සීටීසී (කපා කැබෙලි කර අඹරා සකස් කරන ලද) සහ සම්ප්‍රදායික තේ යන දෙවර්ගයේම නිෂ්පාදන සංයුතියක් මඟින් අනෙකුත් තේ

නිෂ්පාදන රටවල් ප්‍රයෝජන අත්පත් කරගෙන ඇත. සමහර ප්‍රදේශවල විශේෂයෙන් ම මැදි බිම් වගා ප්‍රදේශවල පවත්නා තේ නිෂ්පාදනය සීටීසී තේ සඳහා යොමු කිරීම සමහර විට වඩා හොඳ වැයමක් වනු ඇත. මෙමගින් ලෝක වෙළෙඳපොළේ ශ්‍රී ලංකාවේ තේවල තරඟකාරිත්වය වැඩිකෙරෙනු ඇත. වෙළෙඳපොළේ වෙනස්වීම් වලට අහිතකර ලෙස බලපෑමට ලක්වන මැදිබිම්වල වගා කෙරෙන තේ, සීටීසී තේ සඳහා හැරවීමෙන් මෙම ප්‍රදේශවල වගාවන්හි ලාභදායීකත්වය වැඩි කෙරෙනු ඇත. නිෂ්පාදන සංයුතියේ වෙනස්වීම ද අනාගතයේදී ඇතිවන මිළ පහත වැටීම්වලට කිසියම් ආකාරයේ ආරක්ෂණයක් සළසනු ඇත.

පොල් වගා උප අංශය දළ දේශීය නිෂ්පාදිතයෙහි හිමිකරගෙන ඇති ඉහළ අගය අනුව බලන කල, ඒ ගැන ඉතා සමීප අවධානයක් යොමු කිරීම වටී. පොල් නිෂ්පාදකයන්ගේ ලාභ අසතුටුදායක තත්ත්වයක පවතිමින් තිබේ. කර්මාන්ත සංවර්ධනය කිරීමේ කාර්යභාරයෙහි නිරත විය යුතු අධිකාරීන්ගේ මැදිහත්වීම නිසා පොල් වෙළෙඳපොළ අසම්පූර්ණතාවලට මැදි වී තිබේ.

නිෂ්පාදනයේදී ලබාගෙන ඇති ජයග්‍රහණ හේතු කොටගෙන, දැනට පවත්නා පරිභෝජන සහ සාපේක්ෂ මිළ මට්ටම් යටතේ සහලින් ස්වයංපෝෂිතවීමේ මට්ටම කරා රට ළඟාවී ඇත. කෙසේ වුවද, ආනයනය කරනු ලබන තිරිඟු පිටි සඳහා සහල් ආදේශනය කිරීමේදී වී වලට ඇති ආනයන ආදේශන හැකියාව මෙහිදී සඳහන් කිරීම උචිතය. නිවැරදි මිළ තීරණය කිරීමේ ප්‍රතිපත්ති සකස් කිරීමෙන් සහ තිරිඟු පිටි පරිභෝජනය වෙනුවට සහල් පිටි ආදේශනය කිරීමට පෙළෙඹෙනු සඳහා සහල් පිටි සකස් කිරීමේ කටයුතුවල ආයෝජන දිරිගැන්වීමෙන් දේශීය වී නිෂ්පාදනයෙන් ලැබෙන මුළු ඵල ප්‍රයෝජනය ලබා ගත යුතු වේ. වී නිෂ්පාදනයේ දැනට වැඩිවෙමින් පවතින උපනතිය අනුව, ජාතික ආරක්ෂණ තොග පිළිබඳ අවශ්‍යතා ආනයනවලින් නොව දේශීය මූලාශ්‍ර වෙතින් ඉටුකරගත යුතු වේ.

වී අලෙවි මණ්ඩලයත් ආහාර කොමසාරිස්වරයාගේ දෙපාර්තමේන්තුවත් අතර අලෙවිකරණ කටයුතු පිළිබඳව සම්බන්ධීකරණයක අවශ්‍යතාවය පසුගිය වාර්ෂික වාර්තා කිහිපයක් මගින්ම පෙන්වා දෙනු ලැබීය. මේ රටේ වී/සහල් අලෙවිකරණය පිළිබඳ යථාර්ථයන් පරිපාලනමය කරුණු වලින් වසන් කළ යුතු නැත. ප්‍රතිමූල්‍ය පහසුකම් කෙරෙහි ඇති රැඳියාව අඩු කිරීමත් වෙළෙඳ බැංකු ණය, වී අලෙවි කටයුතු සඳහා යොමු කිරීමත් ඉතා ඉක්මනින් අවධානය ලැබිය යුතු කරුණු වේ. දැනට පවතින නිෂ්පාදන මට්ටමත් සහල් පිළිබඳ කාර්යක්ෂම වෙළෙඳපොළත් යන කරුණු සම්බන්ධයෙන් අලෙවි කටයුතු පිළිබඳ තමන්ගේ තීරණ ගැනීමේ දී වී අලෙවි මණ්ඩලයට නිදහස්ව කටයුතු කිරීමට ඉඩ හළ යුතුය.

වැඩිවෙමින් තිබෙන වී නිෂ්පාදනය සමග සළකා බැලිය යුතු තවත් ප්‍රශ්නයක් වන්නේ, තෙත් කලාපයේ ආන්තික ඉඩම්වලත් වර්ෂා ජලයෙන් ගොවිතැන් කෙරෙන සහ සුළු වාරිමාර්ග ජලය ලැබෙන වියළි කලාපයේ ඉඩම්වලත් වී වගා කිරීම නොකඩවා සිදුකිරීමය. පස සහ භෝග වගා රටාව පිළිබඳ ඉතා සැළකිල්ලෙන් කරනු ලැබූ අධ්‍යයනයකින් පසුව, එවැනි ඉඩම් වඩාත් ආර්ථික පලදාවක් ඇති භෝග සඳහා යොදා ගත හැකිය. මෙම ප්‍රශ්නය කෙරෙහි යෝජිත ඉඩම් කොමිසමේ අවධානය ලැබිය යුතුය. කඩිනම් මහවැලි යෝජනා ක්‍රමය යටතේ ඇති ප්‍රධාන වැඩ අංශ සමාප්ත වීමත් සමග සාධාරණ කාලසීමාවක් තුළදී, මෙම වැඩ පිළිවෙළින් ආර්ථික ඵල ප්‍රයෝජන සාක්ෂාත් කරගැනීමට නම්, පහළ ඇළ පළාත් සංවර්ධනය කිරීම ප්‍රමුඛතාවයක් වශයෙන් අවධානයට ලක්විය යුතුය. මේ අනුව, මහවැලි පහළ නිම්න වාරිමාර්ග ක්‍රමය යටතේ යටිතල පහසුකම්, නිවාස සහ සේවා පහසුකම් ආදිය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ඒකාබද්ධ වැයම් දැරීම අවශ්‍ය වේ.

සුළු ආහාර භෝග උප අංශයෙන් ලැබෙන වාසි තවමත් මෙරටට අත්පත් වී නැත. මීට කලින් වාර්ෂික වාර්තාවේ අවධානය කළ පරිදි, මිළ ප්‍රතිපත්ති සහ වී උප අංශයට දෙන ලද අනෙකුත් දිරිගැන්වීම්වලට මෙම භෝග ඇතුළත් වන පරිදි දීර්ඝ කළ යුතු වේ. ආනයන ආදේශන

අංශ සඳහා ආකර්ෂණීය අවස්ථා ඇති අනෙකුත් කෘෂිකාර්මික කටයුතු වන්නේ, පශු සම්පත් සංවර්ධනය, උක් වගා කිරීම හා සකස් කිරීම, මුං ආදී ධාන්‍ය වර්ග වගා කිරීම සහ ධීවර කර්මාන්ත සංවර්ධනය, යන අංශ වේ. දේශීය වෙළෙඳපොළ අවශ්‍යතා ඉටු කරලීමටත් ජනතාවගේ පෝෂණ තත්ත්වය උසස් කරලීමටත් අරමුණු කරගෙන මෙකී අංශවල විස්තීර්ණ සංවර්ධනයක් ඇති කිරීම සඳහා රජය දැනටමත් ඇප කැපවී ඇත. රජය විසින් ජාතික කෘෂි-කර්මාන්ත, ආහාර සහ පෝෂණ උපාය මාර්ගයක් සකස් කිරීමෙන් ආහාර භෝග, සත්ව පාලනය සහ ධීවර උප අංශවල අපනයන ධාරිතාව වැඩි කරලීම, රැකියා සුලභ කිරීම සහ ජනතාවගේ පෝෂණ තත්ත්වය නංවාලීම කෙරේ ලබාදී ඇති වැදගත් කම අවධාරණය කරයි. මෙම යෝජිත උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රයත්නයක් දැරිය යුතුවේ.

කෘෂිකර්මය කෙරෙහි පමණක් යොමුවීම මගින් අනාගතයේදී ආර්ථිකය, දිගටම පවත්වාගත හැකි සංවර්ධන මාවතක නොපිහිටවනු ඇත. ඉහළ කෘෂිකාර්මික නිමැවුම මගින් ආදායම, සේවා නියුක්තිය, විදේශ සංචිත පුළුල් කිරීමට සහ කාර්මික වර්ධනයේ පදනම ව්‍යාප්ත කිරීමට කරන ලද දායකත්වය අගය කරන අතරම, බාහිරාභිමුඛ අපනයනයට නැඹුරුව, සම්ප්‍රදායානුකූල නොවන කර්මාන්තයන් තුළින් ඉහළ ආර්ථික වර්ධන අනුපාතිකයක් ලඟාකර ගැනීම සඳහා පියවර ගත යුතුව ඇත. ගෙවුම් ශේෂයෙහි පවත්නා මූලික දුර්වලතාවය විසඳීමට සහ සීඝ්‍ර ආර්ථික වර්ධනයක් අත්පත් කරගැනීම සඳහා වන ශ්‍රී ලංකාවේ හැකියාව, ආනයන ආදේශනය තුළින් කෘෂිකර්මයේ පවත්නා අධි ධාරිතාවය ප්‍රයෝජනයට ගැනීමෙන් පමණක් නොව, විශේෂ-යෙන් අපනයන කෙරෙහි යොමු වූ නිසි පරිදි සකසන ලද කාර්මික ප්‍රතිපත්තියක් මතද රඳනු ඇත. පසුගිය අවුරුදු වලදී කර්මාන්ත අංශයේ ක්‍රියාකාරිත්වය සෙමින් පැවතිණි. කාර්මික ආයෝජනය සඳහා වූ දිරිගැන්වීමේ වැඩ පිළිවෙළ මගින් ආනයන ආදේශන කෙරෙහි වාසිදායක තත්ත්වයක් දීමේ නැඹුරුවක් දක්නට ලැබිණි. කෙසේ වුවද, ආනයන ආදේශන කාර්මික සංවර්ධනය සඳහා ඇති හැකියාව දේශීය වෙළෙඳපොළේ සීමිත බව නිසා තවදුරටත් සීමාවේ. පෞද්ගලික නිෂ්පාදන කර්මාන්ත, අපනයන වර්ධන උපාය මාර්ග සඳහා සැළකිය යුතු පරිදි ප්‍රතිචාරයක් දැක්වුවද, කාර්මික අපනයන පුළුල් අන්දමින් ව්‍යාප්ත නොවිය. අතීතයේදී පෞද්ගලික ආයෝජනය, ආකර්ෂණීය සාන්‍ර බල ඇති සහ ඉහළ මූල්‍ය ඵල ගෙන දෙන අංශයන්හි, එනම්, සංචාරක කර්මාන්තය, දේපළ සංවර්ධනය, වෙළෙඳාම සහ මගී ප්‍රවාහන සේවා යන අංශ කෙරෙහි වැඩි වැඩියෙන් යොමු වී තිබිණි.

විමර්ශනයට ලක්වන වසර තුළදී, සානුබල පිළිබඳ ව්‍යුහයේ ආනයන ආදේශන නැඹුරුතාවය වෙනුවට, අපනයන නංවාලීම සඳහා යොමු කිරීමට කිසියම් උත්සාහයක් දරනු ලැබිය. මෙකී පියවරවල් අතර, අපනයන පදනමක් ඇති කර්මාන්ත සඳහා තීරු බදු වලින් නිදහස්ව යන්ත්‍රෝප-කරණ ගෙන්වීම, තෝරාගත් සම්ප්‍රදායික නොවන අපනයන කර්මාන්ත සමහරක් සඳහා වූ අර්ධ බදු විරාමයන් සහ සඵල ආරක්ෂණ පදනමක් අනුව වූ නව තීරු බදු ව්‍යුහයක් හඳුන්වා දීමද ඇතුළත් වේ. මෙකී ප්‍රතිසංස්කරණ මගින් දේශීය නිෂ්පාදන අංශය කෙරෙහි විශාල බලපෑම් සිදු කරනු ඇතැයි බලාපොරොත්තු වේ. කෙසේ වුව ද, ශක්තිමත් සහ ක්‍රියාකාරී කර්මාන්ත ප්‍රතිපත්තියක් මේ රටේ තවමත් දක්නට නොමැත.

බොහෝ දුරට පැහැදිලි වෙමින් පවත්නා කරුණක් නම්, කෘෂි අංශයේ වර්ධනය සඳහා පවතින සීමාවන් නිසා, කර්මාන්ත අංශය ප්‍රධාන වර්ධන අංශයක් බවට පත්වී ඇති බවයි. ප්‍රබල වූත්, කාර්යක්ෂම වූත් කර්මාන්ත ප්‍රතිපත්තියක් සහ ආයෝජන දිරිගැන්වීමේ වැඩ පිළිවෙළක් නිශ්චිතවම අවශ්‍ය වී තිබේ. එහි, මිනිස් බල සහ අනෙකුත් සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ප්‍රයත්නයක් මගින් වෙළඳපොළ බලවේගයන් පිළිබිඹු වන පරිදි සංවර්ධන උපක්‍රම හා ඉලක්ක ඇතුළත් විය යුතුය.

වත්මන් කර්මාන්ත තත්ත්වය පිළිබඳ උනන්දුවක් දක්වන සියළුම පක්ෂ අතර අදහස් හුවමාරුවකින් පසුව, කර්මාන්ත අංශයේ බාධක සහ දුර්වලතා පිළිබඳ විභාග කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් රජය විසින් පත්කරනු ලැබිය. මෙය කාලානුරූප වර්ධනයකි. නව තාක්ෂණය යොදා ගැනීම, කාර්යක්ෂම පරිපාලනය, කාර්මික පදනම විවිධාංගකරණය කිරීම. ප්‍රමාණවත් දිරිගැන්වීම් ලබා දීම, පෞද්ගලික අංශයේ ආයෝ-ජනය ප්‍රසාරණය කිරීම සඳහා සුදුසු වාතාවරණය වැඩි දියුණු කිරීම, පෞද්ගලික අංශය හා ආශ්‍රිත පර්යේෂණ සහ සංවර්ධන කටයුතු නංවාලීම කර්මාන්ත ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමෙහිලා සම්පව සලකා බැලීමට ලක්විය යුතු ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් වන්නේය. සුළු කර්මාන්ත උප අංශයන් ඇතුළත් වන පරිදි, මෙම උපාය මාර්ගය දීර්ඝ කළ යුතු වේ. මන්ද යත්, ව්‍යවසායක සංවර්ධනය සහ නව තාක්ෂණය යොදා ගැනීම මාර්ගයෙන් පවතින තත්ත්වයෙන් ප්‍රයෝජනය ගැනීම සඳහා අති විශාල හැකියාවන් මෙහිලා දක්නට ලැබීමයි.

ආර්ථික වර්ධනය දිගු කාලයක් පවත්වා ගැනීම සඳහා ආර්ථික යටිතල සේවා සංවර්ධනය සහ කාර්යක්ෂම කළමණාකරනය අත්‍යාවශ්‍ය වේ. මෙහිදී ආර්ථිකයේ කාර්යක්ෂමතා මට්ටම වැඩි කිරීම සඳහා ගමනාගමනය සහ පණිවුඩ හුවමාරුව වැදගත් සේවාවන් ඉටු කරයි. ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්‍රමයේ විශේෂයෙන්ම, මගී ප්‍රවාහනයෙහි පවතින අඩු පාඩුකම් ආර්ථික සංවර්ධනයට බාධාවක්ව පවතී.රජය මහජනයාට සතුටුදායක ප්‍රවාහන සේවයක් සැපයීම සඳහා පෞද්ගලික අංශයට බස් සේවා ක්‍රියාත්මක කිරීමට ඉඩ සලසා ඇත. ප්‍රවාහන වෙළෙඳ පොළට ඇතුළු වීමට පෞද්ගලික බස්රථ හිමියනට අවකාශ දීමේ හේතුවෙන් මගී බස්රථ සේවයෙහි සැහෙන ප්‍රමාණයක ආයෝජනයක් සිදුවී ඇති අතර, රාජ්‍ය අංශයේ බස්රථ ගමනා ගමනය මත පැටවී තිබුන බර සාපේක්ෂ ලෙස අඩුවී ඇත. පෞද්ගලික අංශය, පුළුල් බස් සේවාවක් සැපයුවද, එහිලා කරන ලද ආරම්භක ආයෝජනය දැන් යල්පැන ඇති බවක් පෙනේ. බස්රථ ආදිය නැවත සපයා ගැනීම පෞද්ගලික බස්රථ හිමියන් ඉදිරියේ බැරෑරුම් ප්‍රශ්නයක්ව පවතී. දෛනික මාර්ග බස් සේවාවේ විශාල ඇණහිටීමක් මගහරවනු වස්, බස් රථ නැවත සපයා ගැනීම හදිසි අවශ්‍යතාවයක් වන්නේය. මෙම වැදගත් ප්‍රශ්නය සම්බන්ධව රාජ්‍ය අංශයේ බස් සේවාවල කාර්යක්ෂමතාවය වැඩි කිරීමෙහිලා අවශ්‍ය පියවර ගන්නා අතර, පෞද්ගලික ව්‍යවසායකයනට නිසි මාර්ගෝපදේශකත්වය සහ උපදෙස් නිසි බලධාරීන් විසින් ලබා දිය යුතු වේ.

ඉහළ වර්ධන අනුපාතිකයක් ලඟාකරගැනීම සඳහා ආංශික සංවර්ධනයක් ඇතිකරගැනීමේ ප්‍රයත්නය පලදායී සාර්ව ආර්ථික උපක්‍රමයන් මගින් සැහෙන තරම් දුරට ශක්තිමත් කළ යුතුවේ. මෙම ප්‍රයත්නය තුළ මූල්‍ය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල කාර්යක්ෂමතාවය විමර්-ශනය කිරීමේ ක්‍රම ඇතුළත් විය යුතුය. අතීතයේදී පැවති ප්‍රධාන උද්ධමනාත්මක පීඩනය රජයේ අයවැය වෙතින් හටගත් අතර, ඉල්ලුම් කළමණාකරනය පිළිබඳ බර මූල්‍ය ප්‍රතිපත්තිය මත පැටවුනි. 1983 වසරින් පසුව, අයවැය ලේඛන ප්‍රතිපත්තිවල හටගත් වර්ධනයන් මගින් මෙම උපනතිය පසුබස්වාලීමට සමත් වූ අතර, 1984 දී හඳුන්වා දෙනු ලැබූ මූල්‍ය ප්‍රතිපත්ති පියවර මගින් එය සඵල ලෙස අනුපූරණය කර ඇත. රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාවය අඩුකිරීමේ ප්‍රයත්නයන් තව දුරටත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළ යුතුය. මෙසේ කළ යුත්තේ සමුච්චිත අයවැය හිඟයන් මගින් ඇතිවන අධිද්‍රවශීලතාවය අඩු කිරීමට සහ ඉහළ ඉතුරුම් මට්ටමකට අනුකූල වන පරිදි ආයෝජන දිරිගැන්වීමටත්ය.

අයවැය ලේඛනයේ අසමතුලිතතාවය අඩුකරලීමේ ලා ප්‍රධාන වශයෙන් ගතයුතු පියවර ඇතිවිය යුත්තේ ආර්ථික වර්ධන මට්ටමේ සහ ආදායම් ව්‍යුහයේ නම්‍යතාවයෙහි වැඩිවීමක් තුළිනි. සුභසාධක වියදම් තව දුරටත් කපාහැරීමක් ද නැතිව, මේ දක්වා ලබා ඇති සමාජයීය ප්‍රගතියට හානි නොකර, පුනරාවර්තන වියදම් කපා හැරීමට ඇති අවස්ථා සීමිත වේ. පලදායි-තාව සහ වගකීම වැඩිදියුණු කිරීමට ගන්නා පියවර මගින් පුනරාවර්තන වියදම් කළමණාකරනය කිරීම ශක්තිමත් කල යුතු වේ. ආදායම් පදනම පුළුල් කිරීමෙනුත්, ආදායම් බදු ගෙවන්නන්ගේ වඩා හොඳ අනුකූලතාවක් ලබා ගැනීම සඳහා නිසි පියවර හඳුන්වා දීමෙනුත් රජයේ ආදායමේ

අපේක්ෂිත වැඩිවීමක් ඇති කර ගත යුතුය. පුළුල් ආර්ථික අරමුණු සලකා බලා ආයෝජන දිරිගැන්වීම් සහ බදු විරාමයන් පිළිබඳ සංශෝධනයන් කිරීමට කාලය එළඹ තිබේ. පසුගිය වාර්ෂික වාර්තාවල අවධාරණය කර ඇති පරිදි, වාණිජ සහ නිෂ්පාදන කර්මාන්ත වල නියැලි රාජ්‍ය ව්‍යවසායයන් ලාභ ලබන තත්ත්වයක් මත ක්‍රියාත්මක විය යුතු අතර, රජයට ප්‍රතිලාභ ගෙවීම ද සිදුකළ යුතු වේ. රාජ්‍ය ව්‍යවසායයන් යළි හැඩගැස්වීම හදිසි අවශ්‍යතාවයක් ලෙස සළකා ක්‍රියාත්මක කළ යුතුය. පෞද්ගලික අංශය විසින් මනාව පවත්වාගත හැකියයි පෙනෙන රාජ්‍ය වාණිජ හා කාර්මික ව්‍යාපාර රජයේ පාලනයෙන් නිදහස් කිරීම ගැන හොඳින් සිතා බැලීමක් කළ යුතුය. කෙසේ වුව ද, සමහර රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලික අංශයට පවරා දීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුත්තේ, රාජ්‍ය ව්‍යවසායයනට ඒවායේ පරිපාලනමය සහ කාර්යක්ෂමතාවය දියුණු කර ගැනීමට අවස්ථාවක් ලබා දීමෙන් පසුවය.

සේවා නියුක්තිය සහ ආදායම් ව්‍යාප්තිය යන පරමාර්ථයන් සමඟ ගැළපෙන ඉහළ ආර්ථික වර්ධන අනුපාතිකයක් අත්කරගැනීම, පවත්නා වර්ධන හැකියාව යොදා ගැනීමෙන් අත්වන වාසි ප්‍රයෝජනයට ගනිමින්, සියළු අංශයන්හි තුලිත වූ ආර්ථික ප්‍රගතිය සමග යෝග්‍ය පරිදි සැකසිය යුතුය. විශේෂයෙන් වාරි මාර්ග, ජල විදුලිය බලය සහ ඉඩම් සංවර්ධනය ඇතුළු යටිතල පහසුකම්හි අධික ලෙස කරන ආයෝජනයන් හමුවේ ඉහළ ආර්ථික වර්ධන මට්ටමක් සමග ශක්තිමත් ගෙවුම් ශේෂ තත්ත්වයක් ඉලක්ක කොට ගත් යෝග්‍ය වූ ප්‍රතිපත්තිමය දිරිගැන්වීම් සඳහා දැන් අවස්ථාව එළඹ ඇත. පවත්නා ලෝක ආර්ථික තත්ත්වයන් යටතේ ඉල්ලුම් කෙරෙන, සියුම් වූ ද දුෂ්කර වූ ද ව්‍යුහමය සංශෝධන සඳහා විශ්වාසය ඇති කරනුවස්, ආර්ථික ප්‍රතිපත්තීන් හි ස්ථාවරත්වය සහ එකිනෙකට ගැළපෙන සුළු බව, යථාර්ථවාදී හැඟීමකින් යුතුව සහ හැකි ඉක්මනින් කෙටි කාලයක් තුළදී ඒක ජනක ආදායම් දෙගුණ කිරීමේ අරමුණින් ශක්තිමත් කළ යුතුව ඇත.